කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය
தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சு
MINISTRY OF LABOUR AND TRADE UNION RELATIONS



*"A Satisfied Productive Labour Force"*

# 2016

# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# ANNUAL PERFORMANCE REPORT

**කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය**

# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# 2016

**සම්පාදනය**
සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශය

**ප්‍රකාශනය**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය

**වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2016**

**සම්පාදනය**
සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශය

**ප්‍රකාශනය**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය

තැ. පෙ. 1519, දෙවන මහල,
කම්කරු මහලේකම් කාර්යාලය, නාරාහේන්පිට, කොළඹ 05.

**මුද්‍රණය**
ප්‍රින්ටෙක් එස්ටැබ්ලිෂ්මන්ට් පුද්ගලික සමාගම
52/1, එක්වත්ත පාර, මිරිහාන, නුගේගොඩ.
දුරකථන - 011 2815813/ විද්‍යුත් තැපෑල - sales@printec.lk
වෙබ් අඩවිය - www.printec.lk

Printed with VOC free, non toxic vegetable oil-based environmentally-friendly ink, on 100% recycled paper using  wood free pulp which is made from 100% post consumer waste paper
(Paper recycling is the process of recovering waste paper and remarking it into new paper products.)

Recycling one ton of paper saves
17 mature trees, 26 m3 of water, 2.3 m3 of disposal space, 320 liters of oil, and 4,100 kilowatt-hours of electricity.

We encourage you to recycle this Document after use.

Printed by Printec Establishment (Pvt)Ltd - www.printec.lk

# කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය
# වාර්ෂික කාර්යසාධනය - 2016

## ඇතුල් පිටු


| | | පිටුව |
|---|---|---|
| • | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා<br>**අමාත්‍ය ගරු. ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මැතිතුමාගේ පණිවුඩය** | iv |
| • | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා<br>**රාජ්‍ය අමාත්‍ය ගරු. රවින්ද්‍ර සමරවීර මැතිතුමාගේ පණිවුඩය** | vi |
| • | අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවුඩය | viii |
| • | රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්තුමගේ පණිවුඩය | x |
| • | හැඳින්වීම | 01 |
| **අමාත්‍යාංශ කාර්යසාධනය** | | 05 |
| I. | පාලන හා ආයතන අංශය | 05 |
| II. | කම්කරු හා විදේශ සම්බන්ධතා අංශය | 06 |
| III. | සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශය | 07 |
| IV. | මුදල් අංශය | 09 |
| **අමාත්‍යාංශය යටතේ වූ ආයතන** | | 11 |
| I. | කම්කරු දෙපාර්තමේන්තුව | 11 |
| II. | මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | 15 |
| III. | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 21 |
| IV. | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය | 22 |
| V. | කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය | 24 |
| VI. | ශ්‍රම වාසනා අරමුදල | 25 |
| **සංඛ්‍යා ලේඛණ - කම්කරු දෙපාර්තමේන්තුව** | | 27 |
| **ඡායාරූප - අමාත්‍යාංශයේ විශේෂ ක්‍රියාකාරකම්** | | 30 |






# කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය
# ගරු ඩබ්ලිව්.ඩී.ජේ සෙනෙවිරත්න මැතිතුමාගේ පණිවුඩය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයෙහි 2016 වර්ෂයෙහි ප්‍රගතිය විමසා බැලෙන කාර්යසාධන වාර්තාව සඳහා පණිවුඩයක් නිකුත් කරනු ලබන්නේ ඉමහත් සතුටින් සහ අභිමානයෙනි.

***"තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට වැඩ කරන ජනතාව ලබා දෙන සක්‍රීය දායකත්වය අතිශය වැදගත්ය. ඒ සඳහා අසු ලක්ෂයක් ඉක්ම වූ පෞද්ගලික අංශයේ සේවකයෝ සෘජුවම දායක වෙති. සේවක, සේව්‍ය සහ රාජ්‍ය යන ත්‍රෛපාර්ශවීය සම්මුතියෙන් ගොඩනැගෙන කාර්මික සාමය ඒ සඳහා විශාල පිටිවහලක් වේ. වැඩකරන ජනතාව තෘප්තිමත් නිරෝගීමත් ශ්‍රම බලකායක් බවට පරිවර්තනය කර ගැනීමේ වගකීම කම්කරු අමාත්‍යාංශය සතුවේ. ඔවුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරමින්, රටේ නිෂ්පාදන ඵලදායිතාවය ඉහළ නංවා ගැනීමටත්, ආර්ථික සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමටත් අප ලබා දෙන දායකත්වය අතිමහත්ය."***

නිදහස් සාමකාමී පරිසරයක් රට තුළ ගොඩනැගී ඇත. ඒ අනුව වැඩවර්ජන, උද්ඝෝෂණ, උපවාස, විරෝධතා පැවැත්වීම සඳහා සම්පූර්ණ නිදහස මේ වන විට හිමිව තිබේ. එවන් පරිසරයක් තුළ ඇති වුණු වැඩ වර්ජන, කාර්මික ආරවුල් රැසක් විසඳීමට පසුගිය කාලය තුළ අපට හැකි විය. එසේම වතු කම්කරුවන්ගේ වැටුප් ප්‍රශ්නය විසඳමින් සාමූහික ගිවිසුම නැවත පණ ගැන්වීමට ද අපි සමත් වීමු. ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමග එක්ව ළමා ශ්‍රමය පිටුදැකීම වෙනුවෙන් ඉතාමත් වැදගත් කාර්යභාරයක නිරත වීමට ද අපට හැකි විය. එහි අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට දැන් අපි සමත්ව සිටිමු. අයවැය සහන දීමනා පනත පාර්ලිමේන්තුව තුළ සම්මත කර ගනිමින් පෞද්ගලික අංශයේ සේවකයන්ට රුපියල් 2,500කින් වැටුප් වැඩි කර දීම අප ලැබූ විශාල ජයග්‍රහණයකි. එසේම පෞද්ගලික අංශයේ ජාතික අවම වේතනය රුපියල් 10,000ක් බවට පත් කිරීමට ද අපට හැකි විය. ජාතික කම්කරු උපදේශන සභාව අඛණ්ඩව රැස් කරමින් කම්කරු ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග රැසක් ගැනීමට අපට හැකි විය. පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය, සේවක සුබ සාධනය ඉහළ නැංවීමට අවශ්‍ය නිර්දේශයන් ලබා දෙන ලදී. යල් පැනගිය කම්කරු අණපනත් කාලානුරූපීව

වෙනස් කිරීමට අවශ්‍ය පියවර ද ගනු ලැබීය. මේ සියලු කාර්යයන් සඳහා කම්කරු දෙපාර්තමේන්තුව ඇතුළු අකුත් අනුබද්ධ ආයතනයන් මගින් ලබා දුන් සහයෝගය ද අතිමහත්ය.

වර්තමානයේ නව සම්මුතිවාදී පාලන ව්‍යුහයක් රට තුළ ස්ථාපිත වී ඇත. සියලු දේ සාකච්ඡාවෙන් සම්මුතියෙන් විසඳා ගැනීමට අවස්ථාව ලබා දී තිබේ. ඒ සඳහා අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සහ අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ලබා දෙන නායකත්වයද අගය කළ යුතුය. එසේම සංවර්ධනාත්මක අරමුණු වෙනුවෙන් නව සැලසුම් ක්‍රියාත්මක කිරීමටත්, කාර්යක්ෂම පරිපාලනයක් පවත්වාගෙන යාමටත් අවශ්‍ය සහයෝගය මා වෙත නිරන්තරයෙන් ලබා දුන් රාජ්‍ය අමාත්‍ය ගරු රවීන්ද්‍ර සමරවීර මැතිතුමාටත් අමාත්‍යංශ ලේකම්තුමා ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයටත් මාගේ කෘතවේදී ස්තූතිය පුදකරමි.

**ඩබ්ලිව්.ඩී.ජේ සෙනෙවිරත්න (පා. ම.)**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය







## කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍ය
## ගරු රවීන්ද්‍ර සමරවීර
## මැතිතුමාගේ පණිවුඩය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ 2016 වර්ෂයේ කාර්යසාධනය පිළිබඳව නිකුත් කරනු ලබන වාර්ෂික වාර්තාවට සුභ පැතුම් පණිවුඩයක් ලබාදෙන්නේ ඉමහත් සතුටිනි.

***"ශ්‍රී ලංකාවේ අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවයේ නියුක්තව සිටින මිලියන 8.5ක ආසන්න සේවක සංඛ්‍යාවකගේ ජීවන හා සේවා තත්ත්වයන් වර්ධනය කිරීමත්, ඒ තුලින් රටේ නිෂ්පාදන හා ශ්‍රම ඵලදායිතාවය ඉහල නැංවීමටත්, කාර්මික සාමය ඇතිකර සේව්‍ය, සේවක දෙපාර්ශවයේම සුභ සාධනය උදෙසා කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය විසින් ඉටු කරනු ලබන කාර්යභාරය අති මහත්ය."***

මෙම අමාත්‍යාංශය යටතේ ඇති කම්කරු දෙපාර්තමේන්තුව, කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, ශ්‍රම වාසනා අරමුදල සහ මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව ඇතුලු ආයතන විසින් මෙම වර්ෂයේදී සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

කාර්මික ආරවුල්, වැඩ වර්ජන අවම කිරීමත්, සමාජ සුරක්ෂිතතා වැඩ පිළිබඳ ආවරණය පුළුල් කිරීමත්, ළමා ශ්‍රම යෙදවුම් තුරන් කිරීම, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සේවා තත්ත්වයන් හා සේවක අයිතීන් තහවුරු කර රටේ කාර්මික සාමය පවත්වාගෙන යාම සඳහා කාර්මික ආරවුල් සමථ කිරීම හා ආරවුල් විසඳීම කෙරෙහි විශේෂ අවධානය යොමුකර ඇත. එසේම දිවයිනේ සියලු දිස්ත්‍රික්ක අවරණය වන පරිදි මහජන රැකියා සේවා මධ්‍යස්ථාන නවීකරණය කර මහජනතාවට වඩාත් කාර්යක්ෂම සේවයක් ලබා දීමට කටයුතු කර තිබේ.

වත්මන් ආර්ථික හා දේශපාලන පසුබිම තුළ වැඩ කරන ජනතාවට සමාජීය වශයෙන් ස්ථාවරත්වය ගොඩ නැංවීම සඳහා පුද්ගලික අංශයේ වැටුප් වැඩි කිරීමත්, වෘත්තීය සමිති ලියාපදිංචි කිරීමත් රාජ්‍ය හා පෞද්ගලික අංශවල සියලුම වෘත්තීය සමිතිවල කටයුතු රටේ සංවර්ධනයට යොදා ගැනීම පිණිස අවශ්‍ය පියවරයන් හඳුන්වා දී ඒවා ක්‍රියාත්මක කිරීමටත් මෙම අමාත්‍යාංශය ක්‍රියා කර ඇත.

2016 වර්ෂයේදී අමාත්‍යංශයේ අරමුණු ඉටුකර ගැනීමට උර දුන් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මැතිතුමාටත්, අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුලු අමාත්‍යාංශයේ සියලුම නිලධාරීන්ටත් අමාත්‍යාංශය යටතේ ඇති සියලු ආයතන ප්‍රධානීන් ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයටත් මගේ ප්‍රණාමය පුද කරමි.

**රවීන්ද්‍ර සමරවීර (පා.ම)**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍ය







## කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ ලේකම්
## **එස්. එම්. ගෝඨාභය ජයරත්න මැතිතුමාගේ පණිවුඩය**

කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය, රාජ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු හා ආයතන විසින් 2016 වර්ෂයේ දී අත්පත් කරගත් කාර්යසාධනය විස්තර කෙරෙන්නා වු මෙම ප්‍රකාශනය ඔබ අතට පත් කරන්නේ ඉමහත් සතුටිනි.

***"තෘප්තිමත් ඵලදායි ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක් වෙනුවෙන් කම්කරු අයිතීන් සුරකිමින් ඒ සඳහා ශ්‍රම බලකාය සැලසුම් කිරීම අරමුණු කොට කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය හා රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2016 වර්ෂයේ දී සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරනු ලැබූ බව මහත් අභිමානයෙන් යුතුව ප්‍රකාශ කරමි."***

සමාලෝචිත කාලය තුළ රු.මි.8837.9 ක මූල්‍ය ප්‍රතිපාදන යටතේ මහල් 32 කින් යුත් මෙහෙවර පියස ගොඩනැගිල්ලේ කටයුතු අවසන් අදියරට පැමිණ වීමටත් මිගමුව, කිලිනොච්චිය, මුලතිව්, යාපනය හා බෙලිඅත්ත ප්‍රාදේශිය කම්කරු කාර්යාල අළුතින් ඉදිකොට මහජන අයිතියට පැවරීමටත් කුරුණෑගල, අම්බලන්ගොඩ, මහියංගනය, පොළොන්නරුව, අවිස්සාවේල්ල හා අනුරාධපුර කම්කරු කාර්යාල ඉදිකිරීම හා අළුත් වැඩියා කිරීම ආරම්භ කොට වඩාත් ආකර්ෂණීය මහජන සේවාවක් වෙනුවෙන් ක්‍රියාත්මක කරවීමටත් හැකි විය.

නව ජාතික ප්‍රතිපත්තිය හා අනුකූල වෙමින් ජාතික මානව සම්පත් හා රැකිරක්ෂා ප්‍රත්පත්තිය සඳහා කැබිනට් අනුමැතිය ලබා ගෙන ඇති අතර මහජන රැකියා සේවා මධ්‍යස්ථාන 06 ක් මෙම වසර තුලදී විවෘත කර රැකියා පොළවල් හරහා පුද්ගලයින් විශාල ප්‍රමාණයකට රැකියා ලබා දීමට හැකිවිය.

සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම හා අයකරගැනීම් ස්වයංක්‍රියකරණය කිරීම, හා එම සේවාව සියලුම දිස්ත්‍රික් කම්කරු කාර්යාල හා උප කම්කරු කාර්යාල දක්වා විමධ්‍යගත කිරිම, ප්‍රතිලාභ පිවිසුම් යන්ත්‍ර ප්‍රධාන කාර්යාල හා දිස්ත්‍රික් කම්කරු කාර්යාල 30ක ස්ථාපනය කිරිම. 30% ණය ලබා දිම දිස්ත්‍රික් කම්කරු කාර්යාල වෙත විමධ්‍යගත කිරිම මහජන සේවය වෙනුවෙන් අමාත්‍යාංශය ලද ජයග්‍රහණයන් වේ.

ශ්‍රමය සඳහා ජාතික අවම වැටුපක් නීර්ණය

කරමින් 2016 අංක 03 දරණ සේවකයන්ගේ ජාතික අවම වේතන පනත හා අයවැය යෝජනාවට අනුව පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා රු.2500 ක වැටුප් වැඩි කිරීම සඳහා 2016 අංක 04 දරණ අයවැය සහන දීමනා පනත සම්මත කර ක්‍රියාත්මක කරවීම ශ්‍රමය වෙනුවෙන් අප ලද මහත් අභිමානයකි. තවද සුනිසි මෙහෙවර සංකල්පය ප්‍රවර්ධනය කරමින් ආයතනික මට්ටමින් සමාජ කතිකාව ප්‍රවර්ධනය, ජාතික කම්කරු උපදේශන සභාව ක්‍රියාත්මක කිරිම, ළමා ශ්‍රමය පිටු දැකීම, වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතභාවය තහවුරු කිරීම, කාන්තාවන් දැනුවත් කිරිම්, වෘත්තීය පාඨමාලා ලබාදීම, පර්යේෂණ හා විද්වත් කතිකා පැවැත්වීම හා ප්‍රකාශන එළි දැක්වීම වසර තුළ අප ලබා ගත් තවත් ජයග්‍රහණ කිහිපයකි.

ඉහත සඳහන් කළ කාර්යයන් ඉටුකිරීමට අවශ්‍ය නායකත්වය මඟපෙන්වීම හා අනුශාසකත්වය ලබාදුන් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ගරු ජෝන් සෙනෙවිරත්න මැතිදුන්ට හා රාජ්‍ය අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මැතිදුන් වෙත කෘතඥතාව පළ කරමි.

එසේම ඉහත කාර්ය සාධනය අත්කර ගැනීමෙහිලා මහත් වූ කැපවීමෙන් ක්‍රියා කළ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ඇතුලු කාර්ය මණ්ඩලයටත්, කම්කරු කොමසාරිස් ජනරාල්, මිනිස් බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, කම්කරු වන්දි කොමසාරිස්, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් හා ශ්‍රම වාසනා අරමුදලේ සාමාන්‍යාධිකාරී සහ එම ආයතනවල සියලුම මට්ටම්වල නිලධාරීන්ටත්, මෙම ප්‍රකාශනය පිළියෙල කළ අමාත්‍යාංශයේ සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශයේ සියලුම නිළධාරින්ටත් මාගේ කෘතඥතාවය පිරිනමමි.

**එස්. එම්. ගෝඨාභය ජයරත්න**
ලේකම්
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය







## කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්
## **සුනිල් අබේවර්ධන මැතිතුමාගේ පණිවුඩය**

කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය සහ රාජ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ ක්‍රියාත්මක කම්කරු දෙපාර්තමේන්තුව, මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය, ශ්‍රම වාසනා අරමුදල හා කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය යන ආයතන 2016 වර්ෂය තුළ ඉටුකරන ලද කටයුතු පිළිබදව ඉදිරිපත් කෙරෙන වාර්ෂික වාර්තාව වෙනුවෙන් සුභ පැතුම් එක් කරනුයේ මහත් සතුටිනි.

***"මෙම අමාත්‍යාංශය විසින් ජාත්‍යන්තර කම්කරු සංවිධානය ඇතුලු ජාත්‍යන්තර සංවිධාන, ආයතන හා රටවල් සමග සබඳතා ශක්තිමත් කිරීමට අවශ්‍ය කටයුතු ඉටුකිරීම, කම්කරු ක්ෂේත්‍රයට අදාල පර්යේෂණ කටයුතු සිදුකිරීම, කාර්මික සාමය පවත්වාගෙන යාම උදෙසා සේව්‍ය, සේවක හා රජය අතර ත්‍රෛපාර්ශ්වික සම්බන්ධතා ශක්තිමත් කිරීම් වස් ජාතික කම්කරු උපදේශන සභාවේ ක්‍රියාකාරි දායකත්වය ලබාගැනීම සහ අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල කටයුතු සම්බන්ධීකරණය හා මෙහෙයවීම සිදු කරනු ලබයි."***

එසේම කම්කරු අයිතින් සුරක්ෂිත කිරිම, අනර්ථකාරි ළමා ශ්‍රමය තුරන් කිරීම, සේව්‍ය, සේවක සමගිය උදෙසා සමාජ කතිකාවත වැඩ සටහන් පැවැත්වීම, පෞද්ගලික අංශයේ සේවක වැටුප් ඉහළ නංවාලීමට අවශ්‍ය නිති සම්පාදනය, කාර්යාල පහසුකම් සංවර්ධනය උදෙසා "මෙහෙවර පියස" ගොඩනැගිල්ල ඉදිකිරීම ඇතුලු කටයුතු රාශියක් කම්කරු දෙපරේතමේන්තුව විසින් ඉටුකරනු ලබයි. තවද ශ්‍රී ලංකාවේ රැකියා විරහිත තරුණ පිරිස් රැකියා ගැන්විම හා ඔවුන්ට අවශ්‍ය මාර්ගෝපදේශ සපයා දිම සහ රජයේ රැකියා දසලක්ෂයේ වැඩසටහනට පූර්ණ දායකත්වය සපයමින් ඒ සඳහා අවශ්‍ය වැඩ කොටසක් මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව විසින් දියත් කර ඇත. ඊට සමගාමීව 2016 වර්ෂය තුළ රැකියා සේවා (PES) මධ්‍යස්ථාන දිවයිනේ දිස්ත්‍රික්ක 08 ක විවෘත කිරිම හා රැකියා පොළ වැඩසටහන් දිවයින පුරා පැවැත්විම තුලින් පෞද්ගලික අංශයේ රැකියා අවස්ථා සදහා තරුණ පිරිස් යොමු කිරිමට ක්‍රියා කොට ඇත.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ මූලිකත්වයෙන් වැඩ කරන ශ්‍රමික ප්‍රජාවගේ සෞඛ්‍ය තත්වය ආරක්ෂා කිරිම හා අනතුරු අවම කිරීම උදෙසා ක්‍රියා කළ කර්මාන්ත ක්ෂේත්‍රයේ විශිෂ්ඨයන් හට සම්මාන ප්‍රදානයක් 2016 වසරේදී පවත්වන ලදි. එසේම අනතුරු වලට ලක්වූවන්ට සහන ලෙස වන්දි ලබාදීමේ කටයුතු අඛණ්ඩව ඉටුකරමින් දැනට ලබාදෙන වන්දි මුදල වැඩිකිරීමට අදාළ නීති සම්පාදනයට අවශ්‍ය මූලික පියවර ගනිමින් සිටි. පෞද්ගලික හා රාජ්‍ය අංශයේ සේවක පිරිස් උදෙසා කෙටිකාලින හා දිගුකාලින පුහුණු වැඩ සටහන් රාශියක් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක වන අතර කම්කරු ප්‍රජාවගේ සුභ සාධනය උදෙසා ශ්‍රම වාසනා අරමුදලින් අඩු ආදායම්ලාභී පවුල් නගා සිටුවීම උදෙසා වැඩ සටහන් රාශියක් ක්‍රියාවට නැගා ඇත.

මෙම සියලු කටයුතු ඉටුකිරීමේදී ඒ සදහා අවශ්‍ය නායකත්වය හා මගපෙන්වීම ලබාදෙන කම්කරු හා වෘත්තිය සමිති සබදතා ගරු අමාත්‍ය ඩබ්.ඩී.ජේ.සෙනෙවිරත්න මැතිතුමා, ගරු රාජ්‍ය අමාත්‍ය රවින්ද්‍ර සමරවිර මැතිතුමා හා මෙම කටයුතු මැනවින් ක්‍රියාත්මක කරනු ලබන අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුලු කාර්ය මණ්ඩලයටද, මගේ ස්තුතිය පුදකරමි.

**සුනිල් අබේවර්ධන**
ලේකම්
කම්කරු හා වෘත්තිය සමිති සබදතා රාජ්‍ය අමාත්‍යාංශය



# කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය


ශ්‍රී ලංකාවේ අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවයේ නියුක්ත වූවන්ගේ ජීවන හා සේවා තත්ත්වයන් වර්ධනය කිරීම මෙන්ම රටේ නිෂ්පාදනය හා ශ්‍රම ඵලදායිතාව ඉහළ නැංවීමට අවශ්‍ය වන කාර්මික සාමය සහ සේව්‍ය-සේවක සබඳතාව ස්ථාපනය කරමින් අදාළ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ ඒවා ක්‍රියාවට නැංවීම, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ මූලික පරමාර්ථ වේ. සේවක ජනතාවගේ සුබසාධනය උදෙසා වරින්වර ඇතිකරන ලද කම්කරු නීති හා අණපනත් අනුව මෙම අමාත්‍යාංශයට පැවරෙන කාර්ය භාරයද පුළුල්ය. ඒ අනුව අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර පහත පරිදි වේ.

**දැක්ම**


තෘප්තිමත් ඵලදායි ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක්

**මෙහෙවර**

කාර්මික සාමය හා සහයෝගීතාව, සමාජ සුරක්ෂිතභාවය, කම්කරු අයිතිවාසිකම් හා ඵලදායිතාව තුළින් සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම.



## සංවිධාන ව්‍යුහය




ජ්‍යෙ.ස.ලේ - ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | වි.ස. - විදේශ සබඳතා | සැ.ප.සං. - සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන | කා.කා.ස - කාර්යාල කාර්ය සහයක

## කාර්ය මණ්ඩල තොරතුරු - 2016.12.31 දිනට

| | ආයතනය | ජ්‍යෙෂ්ඨ මට්ටම | | තෘතීය මට්ටම | | ද්විතීය මට්ටම | | ප්‍රාථමික මට්ටම | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
| 1 | අමාත්‍යාංශය | 15 | 13 | 04 | 04 | 71 | 52 | 31 | 29 | 122 | 99 | 23 |
| 2 | කම්කරු දෙපාර්තමේන්තුව | 210 | 161 | 668 | 363 | 1771 | 1434 | 489 | 442 | 3138 | 2400 | 738 |
| 3 | මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | 13 | 09 | 02 | 0 | 673 | 538 | 15 | 11 | 703 | 558 | 145 |
| 4 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 09 | 03 | 13 | 04 | 18 | 06 | 05 | 03 | 45 | 16 | 29 |
| 5 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය | 03 | 02 | 07 | 01 | 10 | 07 | 05 | 03 | 25 | 13 | 12 |
| 6 | කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය | 04 | 03 | 03 | 01 | 31 | 16 | 05 | 04 | 43 | 24 | 19 |
| 7 | ශ්‍රම වාසනා අරමුදල | 01 | 01 | 02 | 02 | 07 | 07 | 04 | 04 | 14 | 14 | 0 |
| | **මුළු සේවක සංඛ්‍යාව** | **255** | **192** | **699** | **375** | **2581** | **2060** | **554** | **496** | **4090** | **3124** | **966** |

## අමාත්‍යාංශයේ අරමුණු

- ත්‍රෛපාර්ශවය සවිබල ගැන්වීම තුළින් සේව්‍ය සේවක සබඳතා ශක්තිමත් කිරීම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සේවා තත්ත්වයන් හා සේවක අයිතීන් තහවුරු කිරීම.
- ළමා ශ්‍රම යෙදවුම් තුරන් කිරීම.
- රැකියාවල නියුතු කාන්තාවන් සවිබල ගැන්වීම, ආරක්ෂා කිරීම හා ස්ත්‍රී පුරුෂ සමානතාව දිරිගැන්වීම.
- කම්කරු නීති රීති හා පටිපාටිවල නම්‍යශීලීත්වය ඉහළ නැංවීම.
- සමාජ සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා සුදුසු ක්‍රමෝපායන් සකස් කිරීම.

## අමාත්‍යාංශය වෙත පැවරී ඇති රාජකාරී

2015.09.21 දින ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයට පවරන ලද බලතල, කාර්යයන් හා කර්තව්‍යයන් පහත දැක්වේ.

1. කම්කරු හා වෘත්තීය සමිති සබඳතා විෂයයන්ට සහ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
2. ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන්, සේවක පරිපාලනය සහ සුභසාධනය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
3. ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ ජාත්‍යන්තර සමාජ ආරක්ෂණ සංවිධානය සමග අන්තර් සහයෝගිතාව පවත්වා ගැනීම.
4. සේවක අර්ථසාධක අරමුදල, පෞද්ගලික අර්ථසාධක අරමුදල් සහ පෞද්ගලික විශ්‍රාම ගැන්වීමේ ක්‍රම පරිපාලනය කිරීම.
5. කාර්මික සබඳතා සහ කාර්මික ආරවුල් නිරාකරණය කිරීම.
6. කම්කරු සබඳතාවලට අදාළ නීතිරීති සම්පාදනය සහ නියාමනයට අදාළ කටයුතු.
7. වෘත්තීය සහ රැකියා මාර්ගෝපදේශ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
8. වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශවල සියලුම වෘත්තීය සමිතිවල කටයුතු රටේ සංවර්ධනයට යොදා ගැනීම සඳහා අවශ්‍ය සාධනීය පියවරයන් හඳුන්වා දීම සහ ක්‍රියාත්මක කිරීම.
9. ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
10. රැකියා නියුක්ති ආයතන විසින් ගාස්තු අය කිරීම නියාමනය කිරීම.

11. විරැකියා ප්‍රතිලාභ රක්ෂණ යෝජනා ක්‍රමයට අදාළ කටයුතු.

12. වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

13. කම්කරු දෙපාර්තමේන්තුව, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය, කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය, ශ්‍රම වාසනා අරමුදල සහ මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව යන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු හා අධීක්ෂණය.

14. 2016.09.01 අංක 1982/30 දරණ ගැසට් පත්‍රය මගින් කම්කරු හා වෘත්තිය සමිති රාජ්‍ය අමාත්‍යාශය යටතට මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව හා කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය යන ආයතනයන්හි විෂයන්ට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරිම, පසු විපරම් කිරිම හා ඇගයීම පවරා ඇත.

## ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන අණ පනත්

1. 1934 අංක 19 දරන කම්කරු වන්දි ආඥා පනත.
2. 1935 අංක 14 දරන වෘත්තිය සමිති අඥා පනත.
3. 1939 අංක 32 දරන ප්‍රසුතිකාධාර අඥා පනත.
4. 1941 අංක 27 දරන පඩිපාලක සභා ආඥා පනත.
5. 1942 අංක 45 දරන කර්මාන්තශාලා අඥා පනත.
6. 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත.
7. 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත.
8. 1956 අංක 47 දරන ස්ත්‍රීන් තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ පනත.
9. 1956 අංක 37 දරණ ගාස්තු අයකිරීමේ රැකියා නියුක්ති නියෝජිතායතන පනත.
10. 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත.
11. 1971 අංක 45 දරන කම්කරුවන්ගේ සේවා නියුක්තිය අවසන් කිරීමේ ( විශේෂ විධිවිධාන ) පනත.
12. 1979 අංක 32 දරන සේවක මණ්ඩල පනත.
13. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත.
14. 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල් පනත.
15. 2009 අංක 38 දරන වෘත්තිය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත.
16. 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත.
17. 2016 අංක 03 දරණ සේවකයින්ගේ ජාතික අවම වේතන පනත.
18. 2016 අංක 04 දරණ අයවැය සහන දීමනා පනත

## ශ්‍රී ලංකාවේ යහපත් රැකියා සඳහා වු ජාතික ප්‍රතිපත්තිය

සංවර්ධනය කරා යන මාර්ගයට ශ්‍රී ලංකාව අවතීර්ණ වීමට නම් අභිබවා යා යුතු"යහපත් රැකියා"වලට අදාල ගැටළු පරාසයක් මේ ප්‍රතිපත්ති ප්‍රකාශයෙන් සලකා බලයි. මෙමගින් නිදහස, සාධාරණත්වය, ආරක්ෂාව හා මානව ගරුත්වය යන තත්ත්වයන් තුළ ඵලදායී වැඩ ලබා ගැනීමට කාන්තාවන්ට හා පිරිමීන්ට සමාන අවස්ථා ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂිතය. එසේම මෙම ප්‍රතිපත්තියෙන් රැකියා නිර්මාණය කිරීම පමණක් අපේක්ෂා නොකරන අතර එම නිර්මාණය කෙරෙන රැකියා පිළිගත හැකි තත්ත්වයේ ඒවා විය යුතු වීම විශේෂත්වයකි.

සුනිසි මෙහෙවර වැඩසටහන ප්‍රධාන ස්ථම්භයන් 4ක් තුළ ක්‍රියාත්මක වේ.

- රැකියා උත්පාදනය, ප්‍රවර්ධනය හා ජාතික ඵලදායිතාව.
- වැඩබිමෙහි හිමිකම.
- සමාජ ආරක්ෂණය.
- සමාජ කතිකාවත.

මෙම ප්‍රධාන ස්ථම්භ 4 ට අමතරව පහත දැක්වෙන විෂය ක්ෂේත්‍රයන්ද ආවරණය වන පරදි වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සෑම අංශයක්ම සම්බන්ධීකරණය කරනු ලැබේ.

1 ඵලදායිතා ප්‍රවර්ධනය.
2 ස්ත්‍රී පුරුෂ සමාජභාවය තහවුරු කිරීම.

ඒ අනුව යහපත් වැඩ පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා අමාත්‍යාංශය යටතේ පවතින සියලුම ආයතන විසින් පහත දැක්වෙන විෂය ක්ෂේත්‍රයන් (Thrust Areas )ඔස්සේ කටයුතු කරනු ලබයි.

1 කාර්මික සාමය හා සංහිඳියාව.
2 කම්කරු ප්‍රමිතීන් සහ නීති රීති ක්‍රියාත්මක කිරීම.
3 කාන්තා ශ්‍රමිකයින් සුරැකීම හා ළමා ශ්‍රමය පිටු දැකීම.
4 වෘත්තිය සුරක්ෂිතතාවය හා සෞඛ්‍යය.
5 සමාජ ආරක්ෂණය.
6 කම්කරු ක්ෂේත්‍රයට අදාල අධ්‍යාපන, පුහුණු, පර්යේෂණ සහ සංවර්ධනය.

# අමාත්‍යාංශ කාර්යසාධනය

## 1. පාලන හා ආයතන අංශය

පරිපාලන අංශය, ආයතන අංශය හා මාධ්‍ය ඒකකය පාලන හා ආයතන අංශයේ විෂය පථයට ඇතුළත් වේ. පාලන අංශයට පරිපාලනය, ප්‍රසම්පාදන කටයුතු, කළමනාකරණය, නඩත්තු කටයුතු, පුහුණු කිරීම්, තොරතුරු තාක්ෂණය සම්බන්ධ කටයුතු හා අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයන් සම්බන්ධීකරණය කිරීම යනාදී වගකීම් සම්භාරයක් පැවරී ඇත. ආයතන අංශය මඟින් අමාත්‍යාංශයේ, අමාත්‍ය කාර්යාලයේ හා රාජ්‍ය අමාත්‍ය කාර්යාලයේ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ කටයුතු සිදු කරනු ලබයි. එසේම කම්කරු දෙපාර්තමේන්තුව, කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය, ශ්‍රම වාසනා අරමුදල හා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය යන ආයතනයන්හි මානව සම්පත් කළමනාකරණයට අදාල කටයුතු හා පරිපාලන කටයුතු මෙම මෙම අංශය හරහා ඉටු කරනු ලැබේ. එසේම පාර්ලිමේන්තු ප්‍රශ්න, මහජන පෙත්සම් කාරක සභාව, උපදේශක කාරක සභාව, මානව හිමිකම් කොමිෂන් සභාව යනාදී කාර්යාල මඟින් හා මහජනතාව විසින් එවනු ලබන විවිධාකාර ඉල්ලීම් හා පෙත්සම් සම්බන්ධයෙන් ද ආයතන අංශය කටයුතු කරනු ලබයි.

### ■ මානව සම්පත් සංවර්ධනය

අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනයන්හි නිලධාරීන්හට දෙමළ භාෂා දැනුම වර්ධනය සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව සමඟ එක්ව පාඨමාලා සංවිධානය කරන ලදී. පාලන අංශය මඟින් අමාත්‍යාංශයේ නිලධාරීන්ට තම සේවා අවශ්‍යතාවය මත පශ්චාත් උපාධි පාඨමාලා හා ඩිප්ලෝමා පාඨමාලා හැදෑරීමට මූල්‍ය පහසුකම් සැලසීම ඇතුලු අවශ්‍ය අනෙකුත් පහසුකම් සලසා දෙන ලදී. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, වරලත් ගණකාධිකාරී ආයතනය, ශ්‍රී ලංකා පදනම හා නිපුණතා සංවර්ධන අරමුදල මඟින් පවත්වනු ලබන පුහුණු වැඩමුළු සඳහා නිලධාරීන් සහභාගී කරවන ලදී.

උපාධිධාරී අභ්‍යාසලාභීන් රජයේ ආයතන වල සංවර්ධන ව්‍යාපෘති සඳහා බඳවා ගැනීම යටතේ අමාත්‍යංශයට බඳවා ගනු ලැබූ උපාධිධාරී අභ්‍යාසලාභීන් වෙත පුහුණුව ලබා දී ඇති අතර ඔවුන්ගේ පුහුණුව අවසන් කර ස්ථිර පත්වීමේ දී අමාත්‍යාංශයේ විවිධ අංශවල රාජකාරී කටයුතු සඳහා යොමු කර ඇත.

2016.12.31 දක්වා අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 66 දෙනෙකු පුහුණු පාඨමාලා සඳහා සහභාගී කරවා ඇත.

2016 වසර තුළදී මෝටර් රථයක්, වෑන් රථ දෙකක් හා කැබ් රථ දෙකක් මුදල් අමාත්‍යංශයෙන් ලබා ගැනීමට හැකිවිය.

### ■ වෙනත් විශේෂ කටයුතු

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය හා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් තනතුරු අනුමත කරවාගෙන ඇති අතර එම තනතුරු සඳහා බඳවා ගැනීම් පටිපාටි සකස් කරමින් කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සිදු කර ඇත. අමාත්‍යංශ කාර්ය මණ්ඩලය තුළ පුරප්පාඩුව පැවති ලඝුලේඛක තනතුර සඳහා නව නිලධරයකු බඳවා ගෙන ඇති අතර, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නිලධාරී තනතුර සඳහා වූ පුරප්පාඩුව රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් සම්පූර්ණ කර ඇත.

1978 වැඩවර්ජනය හේතුවෙන් රැකියා අහිමි වූ

තුල්හිරිය හා පූගොඩ පෙහෙකම්හල්වල සේවය කළ සේවකයන් 2396 දෙනෙකුට වන්දි ලබා දීම සඳහා 2014.05.13 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කරන ලදුව එහි සඳහන් කරුණු සලකා බලා 2014.05.29 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අදාළ සේවකයින් 2396 දෙනෙකුට/ ඔවුන්ගේ යැපෙන්නන්ට අවසන් කරුණා සහගත දීමනාවක් වශයෙන් රු.25,000/= බැගින් ගෙවීමට අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව 2016.12.31 දින වන විට අයදුම්පත් යොමු කළ අයගෙන් අනන්‍යතාව තහවුරු කරගත් 2242 දෙනෙකු සඳහා රු.මිලියන 56.05 ක් ගෙවා අවසන් කර ඇත.

2014 අයවැය මඟින් කරන ලද යෝජනාවක් අනුව 1980 ජූලි වර්ජනයට ලක්ව රැකියා අහිමි වූ පෞද්ගලික හා රාජ්‍ය ආයතනයන්හි සේවකයන් සඳහා වන්දි ගෙවීමට අදාලව කටයුතු සම්බන්ධීකරණය කරමින් මුදල් අමාත්‍යාංශය වෙත නිර්දේශ ලබා දීමට කටයුතු කරමින් රැකියා අහිමි වූවන් වෙත සහන සැලසීමට කටයුතු කරමින් සිටී. ඒ අනුව 2015 වසරේ අයදුම්කරුවන් 1712 ක් හා 2016 වසරේ 219 ක් වශයෙන් මුළු අයදුම්කරුවන් 1931 ක් සඳහා ජූලි වර්ජක දීමනා ගෙවීමට නිර්දේශ කර මුදල් අමාත්‍යාංශය වෙත යොමුකර ඇත.

## 2. කම්කරු සහ විදේශ සබඳතා අංශය

ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමග එම සංවිධානයේ සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව විසින් ඇති කරගත් බැඳීම, අන්තර් ජාතික වශයෙන් පිළිගත් සම්මුතීන් හා නිර්දේශයන් යටතේ මෙරට කම්කරු අයිතීන් සුරක්ෂිත කිරීම සහ කම්කරු ක්ෂේත්‍රයේ ගැටළු විසඳීම සඳහා උපයෝගී කර ගැනීමට අදාලව කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය වෙනුවෙන් කටයුතු කිරීම මෙම අමාත්‍යාංශයේ කම්කරු හා විදේශ සබඳතා අංශය මගින් සිදු කරනු ලබයි.

### 2016 ජනවාරි 01 සිට 2016 දෙසැම්බර් 31 දක්වා කාර්යසාධනය

01. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ව්‍යවස්ථාවේ අංක 19 හා අංක 22 යටතේ වාර්ෂිකව ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙත යැවිය යුතු වාර්තා සකස් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු රැස් කිරීම, විශ්ලේෂණය කිරීම හා එම වර්තා සම්පාදනය කිරීම.

02. විදේශ කටයුතු අමාත්‍යාංශය සහ අනෙකුත් රජයේ අමාත්‍යාංශ වෙත කම්කරු ක්ෂේත්‍රයට අදාළ වන නව ප්‍රවණතා පිළිබඳ වර්තා සම්පාදනය කිරීම.

    I) EU GSP+ සහනය ලබා ගැනීම සම්බන්ධව ඇති ගැටළු නිරාකරණය කිරීමේ වාර්තාව සඳහා කම්කරු ක්ෂේත්‍රයට සම්බන්ධ පරිච්ඡේදය සම්පාදනය කිරීම සහ ඒ සම්බන්ධව තව දුරටත් කටයුතු කිරීම.

    II) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාර්ෂිකව ප්‍රකාශයට පත් කරන කාලීන ආර්ථික සංවර්ධනයේ වැදගත් අංශ සහ ආර්ථික සංවර්ධනයේ ඉදිරි දැක්ම සම්බන්ධයෙන් වන වාර්තාවට සහ 2016 වාර්ෂික වාර්තාවට අදාල තොරතුරු සැපයීම.

03. ත්‍රෛපාර්ශවීය නියෝජනයෙන් යුක්තව සෑම මසකම රැස්වන ජාතික කම්කරු උපදේශක සභා රැස්වීමේදී පහසුකම් සපයන්නා ලෙසට ක්‍රියා කිරීම. මෙහිදී 2015 අයවැය යොජනා වලට අදාලව පෞද්ගලික අංශයේ වැටුප් වැඩි වීම සම්බන්ධයෙන් අදාල සේව්‍ය, සේවක දෙපක්ෂයේම යෝජනා සහ එයට අදාල සංශෝධන ක්‍රියාත්මක කිරීමට අදාල පසුබිම සැකසීම මෙම වසර තුළ සිදු කරන ලදී.

04. අපරානුමත නොකරන ලද ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අවිධිමත් ආර්ථිකයේ සිට විධිමත් ආර්ථිකයක් දක්වා සංක්‍රමණය වීම සම්බන්ධයෙන් වු 204 නිර්දේශය පාර්ලිමේන්තුවේ දැනගැනීම සඳහා සිංහල, දමිළ හා ඉංග්‍රිසි භාෂා ත්‍රිත්වයෙන් ඉදිරිපත් කිරීම.

05. වාර්ෂිකව පැවැත්වෙන ජාත්‍යන්තර කම්කරු සමුළුව සඳහා ත්‍රෛපාර්ශවීය නියෝජිතයන් සහභාගී කරවීමට අදාල අදාල සියලුම කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ පසුවිපරම් කටයුතු සිදු කිරීම

06. 2016 වසරේ ඉන්දුනීසියාවේ පැවැති ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 16 වන ආසියානු පැසිපික් කලාපීය සම්මේලනයට ත්‍රෛපාර්ශවීය නියෝජිතයන් සහභාගී කරවීමට අදාල සියලු සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

07. කම්කරු ක්ෂේත්‍රයේ සහයෝගීතාව ගොඩනැංවීම උදෙසා සිදු කරන ලද ශ්‍රී ලංකාවේ සහ විදේශීය නිල දූත සංචාර සම්බන්ධව කටයුතු කිරීම.

08. ශ්‍රී ලංකාවේ කම්කරු ක්ෂේත්‍රය හා සම්බන්ධව පවතින ගැටළු විසඳීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සහයෝගය ඇතිව අධ්‍යයන කටයුතු සිදු කිරීමට අවශ්‍ය පියවර ගැනීම

I. මාතෘත්ව ආරක්ෂණ ප්‍රතිලාභ ක්‍රමයක් ඇති කිරීම (Towards Maternity Insurance Scheme for Sri Lanka)

II. වෘත්තිය අනතුරු ආරක්ෂණ ක්‍රමයක් ඇති කිරීම (Employment Injury Insurance Scheme for Sri Lanka)(EIIS)

III. අවිධිමත් ආර්ථිකයන් සම්බන්ධව සමාජ ආරක්ෂණ තලයක් ඇති කිරීම (Social Protection Floor for Informal Sector)

09. කම්කරු ක්ෂේත්‍රයට අදාළ අණපනත් ප්‍රතිපත්තීන් සංශෝධනය කිරීම සහ නව පනත් ආරම්භ කිරීම පිළිබඳ කරුණු, ප්‍රවණතාවයන් හා අවශ්‍යතාවයන් සාකච්ඡා කිරීම සඳහා විශේෂිත කමිටුවක් වන කම්කරු නීති හා ප්‍රතිපත්ති සම්බන්ධයෙන් වන ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම පැවැත්වීම.

10. 2016 අංක 4 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනත සහ 2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනත සම්මත කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

11. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සේවා නියුක්ති ප්‍රතිපත්තිය(1964)-C122 සම්මුතිය අපරානුමත කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.

12. කම්කරු අමාත්‍යාංශයේ සහ කම්කරු දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරීන් විදේශ පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීමට අදාල සියලුම කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ පසුවිපරම් කටයුතු සිදු කිරීම. 2016 ජනවාරි සිට 2016 දෙසැම්බර් කාල සීමාව තුළ නිලධාරීන් 40 ක් විදේශ පුහුණු පාඨමාලා සහ වැඩමුළු සඳහා සහභාගී වී ඇත.

13. ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මූල්‍ය සහයෝගීතාව ඇතිව ක්‍රියාත්මක කරන Child Activity Survey සම්බන්ධයෙන් අමාත්‍යාංශයට අදාල ව සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

14. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 2017 සමුළුවාරය සඳහා සාකච්ඡාවට ගැනෙන ප්‍රශ්නාවලිය වන "Report for the item V of the 106th Session (2017) of the International Labour Conference: Revision of the Employment (Transition from War to Peace) Recommendation, 1944 (No.71)" සඳහා පිළිතුරු යැවීම.

15. ශ්‍රී ලංකාව තුළ ළමා ශ්‍රමය තුරන් කිරීමේ අරමුණින් සකස් කරන ලද ජාතික ප්‍රතිපත්තිය සම්පාදනය කිරීමට සහාය වීම හා කැබිනට් අනුමැතිය ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

16. කම්කරු අමාත්‍යාංශය ඇතුළු අමාත්‍යාංශයට අනුබද්ධිත සියලුම ආයතනවල සේවය කරනු ලබන නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා කම්කරු කතිකාවත පැවැත්වීම. ඒ අනුව කම්කරු ක්ෂේත්‍රයට අදාළ වන මාතෘකාවන් ඔස්සේ 2016 වසර තුළදී වැඩසටහන් 5 ක් පවත්වන ලදී.

17. ශ්‍රී ලංකාවේ හා ඉන්දියාවේ ප්‍රවාසික සේවකයින්ගේ සමාජ ආරක්ෂණය සම්බන්ධයෙන් දෙරට රජයන් අතර ගිවිසුමකට එළඹීමට අදාළ කටයුතු සිදු කිරීම.

18. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 2003 අංක 185 දරන මුහුදු යන්නන්ගේ අනන්‍යතා ලියවිලි පිළිබඳ සම්මුතිය අපරානුමත කිරීම.

## 3. සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශය

අමාත්‍යාංශය හා ඒ යටතේ වන සියලුම ආයතනවල සංවර්ධන වැඩසටහන් නිවැරදි ඉලක්ක ඔස්සේ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම, ඒවා ක්‍රියාත්මක කරවීම, ප්‍රගති සමාලෝචනය හා පසුවිපරම් කිරීම, මෙම අංශයෙන් සිදු කෙරෙන ප්‍රධාන කාර්යභාරය වේ. මෙයට අමතරව පහත සඳහන් කාර්යයන්ද මෙම කාල පරිච්ඡේදය තුළ අංශය විසින් ඉටුකර ඇත.

1. අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන විසින් සිදු කරනු ලබන සංවර්ධන ඉලක්කයන් ඇතුලත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අදාල පාර්ශව වෙත යොමු කිරීම.
   - ශූන්‍ය පාදක අයවැය සංවර්ධන

වැඩසටහන යටතේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සෑම මසකම ප්‍රගතිය ඇගයීම.

2. 06/2015 (1) ජාතික අයවැය චක්‍රලේඛ අනුව ජනාධිපති ලේකම් කාර්යාලය, මුදල් අමාත්‍යාංශය, ව්‍යාපෘති කළමණාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව හා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණය පැවැත්වීම හා ප්‍රගති වාර්තා මාසිකව හා ත්‍රෛමාසිකව ඉදිරිපත් කිරීම.

3. පාර්ලිමේන්තුවේ අයවැය කාරක සභා අවස්ථාව සඳහා ප්‍රගති වාර්තාව ඉදිරිපත් කිරීම.

4. 2015 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව සකස් කිරීම.

5. ශ්‍රී ලංකා සේවක සඟරාව ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධ සියලු කටයුතු සිදු කිරීම.
   - සමාලෝචන කාලයට අදාලව ශ්‍රී ලංකා සේවක සඟරාවේ කාණ්ඩ අංක 66-4 වන කාලාපය හා 67 කලාපයේ 1,2,3 කාර්තුමය වශයෙන් නිකුත් කරන ලදී.

6. අර්ධ වාර්ෂික පුවත් සඟරාවේ (Labour Eye) පළමු හා දෙවන කලාප ප්‍රකාශයට පත්කර ඇත.

7. යහපත් රැකියා පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හා ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

8. සුනිසි මෙහෙවර වැඩසටහන යටතේ රුපියල් මිලියන 08 ක් විවිධ ආයතන හා අංශයන් වලට වෙන් කරන ලද අතර 2016 දෙසැම්බර් 31 වන දිනට එහි ප්‍රගතිය පහත දැක්වේ. ඒ අනුව 2016 දෙසැම්බර් 31 දිනට සමස්ථ ප්‍රගතිය 96.62% ක් වේ.

| ව්‍යාපෘති ක්‍රියාත්මක වන ආයතන | වෙන් කළ මුදල (රු.මිලියන) | 2016.12.31 දක්වා ප්‍රගතිය (රු.මිලියන) | % |
|---|---|---|---|
| කම්කරු දෙපාර්තමේන්තුව | 4.5 | 4.47 | 99.33 |
| ජාතික වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය | 0.5 | 0.46 | 99.00 |
| කම්කරු අමාත්‍යාංශය | 3.0 | 2.80 | 93.85 |
| **එකතුව** | **8.0** | **7.73** | **96.62** |

9. කම්කරු විෂය ක්ෂේත්‍රය පිළිබඳව විද්වත් කතිකාවක් (Symposium on Labour & Employment) පවත්වන ලදී. ඒ සඳහා පර්යේෂණ වාර්තා 41 ලැබුණු අතර ඉන් තෝරා ගත් වාර්තා 21 සඳහා සම්පූර්ණ වාර්තා කැඳවූ අතර කථිකාවත සඳහා වාර්තා 10ක් ඉදිරිපත් කරන ලදී. 2016 නොවැම්බර් මාසයේ 04 වැනි දින කතිකාව පවත්වන ලද අතර එදින ඉදිරිපත් කරන ලද පර්යේෂණ වාර්තා එක් කොට ජර්නලයක් ප්‍රකාශයට පත් කරන ලදී.

10. අමාත්‍යාංශයේ 2020 දැක්ම සකස් කිරීම සඳහා, කම්කරු හා ඊට ආංශික වූ ක්ෂේත්‍ර අත්කර ගත යුතු තත්වයන් පිළිබදව සැලැස්මක් සකස් කර ගැනීම සඳහා අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවල ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් දෙදින නේවාසික වැඩමුළුවක් 2016.02.12 හා 13 දින වල බණ්ඩාරගම සර්වෝදය පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්වුනි. එම අදහස් ආශ්‍රයෙන් 2020 දක්වා අමාත්‍යාංශයේ උපක්‍රමික සැලසුම් වාර්තාව ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

11. කම්කරු ක්ෂේත්‍රය, කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය හා ඒ යටතේ දෙපාර්තමේන්තු හා ආයතන ශ්‍රී ලංකාවේ කම්කරු ක්ෂේත්‍රයේ විකාශය පිළිබඳව සාරාංශගත කරන ලද තොරතුරු ඇතුලත් "Sri Lanka Labour Way Forward" ප්‍රකාශයට පත් කරන ලදී.

12. ලංකාව තුළ සීඝ්‍රයෙන් වර්ධනය වන බෝ නොවන රෝග තත්වයන් පාලනය කිරීමේ අරමුණින් අමාත්‍යාංශයේ හා කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා යෝගී ව්‍යායාම ක්‍රම පුහුණු වැඩසටහනක් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වෛද්‍යවරියන් දෙදෙනෙක් මගින් සෑම බ්‍රහස්පතින්දාවකම

උදෑසන 7.00 සිට 8.30 වන තුරු පැවැත්වේ.

13. අම්පාර ප්‍රදේශයේ ඉදිකරමින් පවතින සංචාරක නිවාසයේ ඉදිකිරීම් කඩිනමින් නිම කිරීමට අපේක්ෂිතයි. මෙහි ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලි. 28 ක් වේ.

14. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපළ තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය තහවුරු කිරීම සඳහා වැඩසටහන් පවත්වන ලදී. මෙම වැඩසටහන් පැවැත්වීමේ ප්‍රධාන අරමුණ වනුයේ සේවා ස්ථාන වල යහපත් වැඩ පරිසරයක් නිර්මාණය කිරීම තුළින් ශ්‍රම ඵලදායිතාවය ඉහළ නැංවීමයි. කම්කරු දෙපාර්තමේන්තුවේ සහ මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු කම්කරු නිළධාරීන්, මානව සම්පත් සංවර්ධන නිළධාරීන් සහ සංවර්ධන නිළධාරීන් සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය වැඩලොව තුළ ප්‍රවර්ධනය කරන ආකාරය පිළිබද පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළු පවත්වන ලදී.

| තේමාව | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය ප්‍රවර්ධනය තුළින් යහපත් වැඩ පරිසරයක් නිර්මාණය කිරීම | ආයතන සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් - 05 | 447 |
| ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබද මූලික සංකල්ප හා වැඩ ලෝකය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය මූලප්‍රවාහගත කිරීමේ පියවර | පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැටසටහන් - 06 | 280 |

## 4. මුදල් අංශය

2016 ජනවාරි සිට 2016 දෙසැම්බර් 31 දක්වා
අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රගතිය

| වැඩසටහන | ව්‍යාපෘතිය | වියදම් වර්ගය | ප්‍රතිපාදනය | වියදම | ඉතිරිය | වියදම් ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|
| 1 | 1 | පුනරාවර්තන | 25,201,000 | 23,781,598 | 1,419,402 | 94 |
| | | මූලධන | 2,700,000 | 2,333,519 | 366,481 | 86 |
| | | එකතුව | 27,901,000 | 26,115,117 | 1,785,883 | 94 |
| 1 | 2 | පුනරාවර්තන | 106,881,000 | 101,442,575 | 5,438,425 | 95 |
| | | මූලධන | 22,659,000 | 22,411,085 | 247,915 | 99 |
| | | එකතුව | 129,540,000 | 123,853,660 | 5,686,340 | 96 |
| 1 | 11 | පුනරාවර්තන | 25,228,000 | 23,543,320 | 1,684,680 | 93 |
| | | මූලධන | 9,914,391 | 9,848,444 | 65,947 | 99 |
| | | එකතුව | 35,142,391 | 33,391,764 | 1,750,627 | 95 |
| 2 | 3(2) | පුනරාවර්තන | 9,500,000 | 9,500,000 | - | 100 |
| | | මූලධන | 3,000,000 | 2,481,015 | 518,985 | 83 |
| | | එකතුව | 12,500,000 | 11,981,015 | 518,985 | 96 |
| 2 | 3(3) | පුනරාවර්තන | 3,211,790 | 3,211,790 | - | 100 |
| | | මූලධන | 12,000,000 | 12,000,000 | - | 100 |
| | | එකතුව | 15,211,790 | 15,211,790 | - | 100 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2 | 4 | පුනරාවර්තන | 48,439,000 | 47,389,090 | 1,049,910 | 98 |
| | | මූලධන | 1,100,000 | 686,543 | 413,457 | 62 |
| | | එකතුව | 49,539,000 | 48,075,633 | 1,463,367 | 97 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2 | 5 | පුනරාවර්තන | 25,140,000 | 24,885,134 | 254,866 | 99 |
| | | මූලධන | 550,000 | 445,600 | 104,400 | 81 |
| | | එකතුව | 25,690,000 | 25,330,734 | 359,266 | 99 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | මුළු එකතුව | පුනරාවර්තන | 243,600,790 | 233,753,507 | 9,847,283 | 96 |
| | | මූලධන | 51,923,391 | 50,206,206 | 1,717,185 | 97 |
| | | එකතුව | 295,524,181 | 283,959,713 | 11,564,468 | 96 |

# අමාත්‍යාංශය යටතේ වූ ආයතන

## 01. කම්කරු දෙපාර්තමේන්තුව

සමස්ත ශ්‍රී ලාංකේය කම්කරු පන්තියේ බහුතරයක් නියෝජනය කරනු ලබන අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවක ප්‍රජාව පාදක කර ගනිමින් ඔවුන්ගේ සුබසාධනය මෙන්ම සේව්‍ය සේවක සබඳතාවයන් සුරක්ෂිත කරමින් වඩාත් ප්‍රශස්ථ මට්ටමකින් සිය ආයතනික ඵලදායිතාවය නංවාලීමට කටයුතු කරනු ලබන කම්කරු දෙපාර්තමේන්තුව වර්තමානය වන විට ඉහත අරමුණු සාධනය කර ගැනීමෙහිලා ක්‍රියාත්මක වන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය බවට පත්ව ඇත.


කම්කරු ක්ෂේත්‍රය පාදක කොට ගනිමින් ශ්‍රී ලංකා ව්‍යවස්ථාදායකය විසින් වර්ෂ 1923 සිට වසර 94 ක් තුළ සම්මත කර ගැනීමෙන් නීතියෙන් බලගැන්වූ අණ පනත් බොහෝ සංඛ්‍යාවක් උදෙසා පසුව එක් කරන ලද සංශෝධන සහිතව අවශ්‍යතාව මතුවන පරිදි ක්‍රියාත්මක කරලීම කම්කරු දෙපාර්තමේන්තුවේ වත්මන් කාර්යභාරය වේ.

ඒ අනුව, කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට අනුබද්ධව අත්‍යාවශ්‍ය අංශ 13 ක් ක්‍රියාත්මකව පවතින අතර, දිවයින පුරා විසිරී සිටින කම්කරු ප්‍රජාවගේ අපේක්ෂිත සේවා පහසුකම් සපුරා ගැනීමට නීතිමය රැකවරණයත්, සුභසාධනයත් සැලසීමේ අදිටනින් කලාප කම්කරු කාර්යාල 11 ක්ද, දිස්ත්‍රික් කම්කරු කාර්යාල 40 ක්ද, උප කම්කරු කාර්යාල 17 ක් හා දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 10 ක්ද දිවයින පුරා පිහිටුවා ඇත.

### දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

- කම්කරු සුභසාධනය හා ප්‍රවර්ධනය උදෙසා සුසැදි අණපනත් ක්‍රියාවට නැංවීම සහ කාර්මික ආරවුල් සමථයකට පත් කිරීම
- කම්කරු ප්‍රජාව පාදක කරගත් සමාජ ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- කම්කරු ක්ෂේත්‍රය පිළිබඳව සමීක්ෂණ පැවැත්වීම, කම්කරු ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයට හා කම්කරු ප්‍රජාවගේ අභිවෘද්ධියට පාදක වන ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් සකස් කිරීම, බාහිර හා අභ්‍යන්තර දැනුවත් කිරීමේ හා අධ්‍යාපනය ලබාදීමේ කටයුතු සිදු කිරීම
- කම්කරු ක්ෂේත්‍රයට අදාළ පාර්ශවකරුවන් අතර සමාජ කතිකාවත ප්‍රවර්ධනය කිරීම
- කම්කරු ක්ෂේත්‍රයට අදාළ සංඛ්‍යා ලේඛන රැස් කිරීම, විශ්ලේෂණය කිරීම හා ඉදිරිපත් කිරීම
- වෘත්තීය සමිති සමග සබඳතා යහපත්ව හා සජීවී අයුරින් පවත්වා ගෙන යාම
- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ශ්‍රී ලංකා නියෝජිතයා වශයෙන් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය සමග සහයෝග යෙන් හා සජීවී ආකාරයෙන් කටයුතු කිරීම


## දෙපාර්තමේන්තුවේ සංවිධාන සැකැස්ම



## කාර්මික සාමය

යම්කිසි රටක තෘප්තිමත් ශ්‍රම බලකායක් සිටීම එම රටෙහි සංවර්ධන ක්‍රියාදාමයට මහඟු පිටිවහලක් වේ. ඒ අනුව, යහපත් කාර්මික සාමයක් උදෙසා කම්කරු දෙපාර්තමේන්තුව සතු නිලධාරීන් විසින් දිවයින පුරා සිදුකරනු ලබන කම්කරු පරීක්ෂණ හේතුවෙන් කාර්මික ආරවුල් ප්‍රමාණය අඩු වීමත් රටේ සමස්ථ ඵලදායීතාවය ඉහළ නැංවීමත් දක්නට ඇත.

කාර්මික ආරවුල් ප්‍රමාණය 2012 - 2016





## සේවක අර්ථසාධක අරමුදල

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ ස්ථාපිත කර ඇති සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රධාන කාර්ය භාරය වනුයේ ආයතන සහ සේවකයන් සේවක අර්ථසාධක අරමුදලෙහි ලියාපදිංචි කිරීමේ කටයුතු සිදුකර සේවා යෝජකයන්ගෙන් අදාල දායක මුදල් අයකර ගැනීමත් සාමාජිකයන්හට සේවක අර්ථසාධක අරමුදලෙහි ප්‍රතිලාභ ගෙවීමත් ය.

වර්තමානයේදී මෙම අරමුදල විශ්‍රාමික ප්‍රතිලාභවලට පමණක් සීමා නොවේ. මේ වන විට වසර 10කට වැඩි කාලයක් අරමුදලට දායක වී ඇති, සේ.අ.අ. ශේෂය රුපියල් 300,000/-ට වැඩි, දැනට අරමුදලට දායක මුදල් ගෙවන සේවා නියුක්තිකයන් හට නිවාස ඉදිකර ගැනීමට හෝ වෛද්‍ය ආධාර ලබා ගැනීම සඳහා සිය අරමුදල් ශේෂයෙන් 30% ක විශ්‍රාම පූර්ව ප්‍රතිලාභ ලබා ගත ගැනීමේ පහසුකම අරමුදල විසින් පිරිනමා ඇත.

පසුගිය වසර 05ක කාලසීමාව තුල දායක මුදල් රැස් කිරීමේ ප්‍රගතිය පහත පරිදි වේ.

දායක මුදල් රැස් කිරීම 2012 - 2016




## කාන්තාවන් හා ළමයින් පාදක කරගත් වැඩසටහන්

ශ්‍රී ලාංකේය ශ්‍රම බලකායේ සැලකිය යුතු ප්‍රතිශතයක් නියෝජනය කරනු ලබන කාන්තා සේවා නියුක්තිකයන්ගේ වෘත්තිය අයිතිවාසිකම් හා ආරක්ෂාව මෙන්ම කාන්තාවකට ඇයගේ සෞඛ්‍ය මෙන්ම සුබ සාධනය සම්බන්ධ පහසුකම් හා වරප්‍රසාද සැලසීමේ අරමුණෙන් යුතුව දෙපාර්තමේන්තුව අණපනත් කිහිපයක් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව, "සවිමත් කතක් - තිරසර හෙටක්" යන තේමා පාඨය යටතේ වසරේ ජාත්‍යන්තර කාන්තා දින සැමරුම 2016.03.07 දින රත්නපුර දිස්ත්‍රික්කයෙහිදී පවත්වන ලදී. එසේම වැඩකරන කාන්තාවන් දැනුවත් කිරීමේ අරමුණින් වතු සේවිකාවන් දැනුවත් කිරීමේ වැඩසටහන් 2 ක්ද කර්මාන්තශාලා සේවිකාවන් දැනුවත් කිරීමේ වැඩසටහන් 10 ක්ද පවත්වන ලදී. ආයෝජන ප්‍රවර්ධන කලාපයන්හි සේවිකාවන්ගේ පෞද්ගලික සහ මානසික ගැටළුවලට පිළියමක් ලෙස කටුනායක, බියගම හා කොග්ගල කලාප තුළ මනෝවිද්‍යා උපදේශන වැඩසටහන් පවත්වන ලදී. නිදහස් වෙළඳ කලාප සේවිකාවන් උදෙසා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්ද පවත්වන ලදී.

එසේම බාල වයස්කාර දරුවන් ගෘහ සේවයේ හා වෙනත් අවදානම් සහගත සේවාවන්හි යෙදවීමේ ගැටළුවට පිළියම් ලෙස ළමා ශ්‍රමය වැළැක්වීමේ මූලික අරමුණින් යුතුව කම්කරු දෙපාර්තමේන්තුව සිය දිස්ත්‍රික් කම්කරු කාර්යාල සමග ඒකාබද්ධව පරීක්ෂණ කටයුතු සිදු කරනු ලැබේ. එසේම, ජාත්‍යන්තර ළමා ශ්‍රම විරෝධී දින සැමරුම් උත්සවය 2016.06.22 දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී. ළමා ශ්‍රමය හා අනතුරුදායක ළමා ශ්‍රමය වැළැක්වීම පිළිබඳව ජාතික මට්ටමින් අවධානය යොමු කරවීම මෙහි අරමුණ විය. මෙම සැමරුම් උත්සවයේදී අතිගරු ජනාධිපතිතුමා විසින් ශ්‍රී ලංකාවෙන් ළමා ශ්‍රමය තුරන් කිරීමේ ප්‍රතිඥාව කියවීම හා එයට අත්සන් තැබීමද ශ්‍රී ලංකාවෙන් ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ කෙටි පණිවිඩය (SMS) නිකුත් කිරීමද සිදු කරන ලදී.

ලෝක ළමා දින සැමරුම් උත්සවය කොළඹ 07 ධර්ම විජය පදනම් ආයතන ශාලාවේදී පවත්වන ලද අතර එහිදී කොළඹ දිස්ත්‍රික්කය තුළ තෝරා ගත් අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් 100 දෙනෙකු වෙත පාසල් උපකරණ පිරිනමන ලදී.

## වැටුප් හා සේවා කොන්දේසි

පෞද්ගලික අංශයේ සේවා නියුක්ත වූවන්ගේ රැකියා සුරක්ෂිතතාවය සහ සුභසාධනය කෙරෙහි බලපාන සේවා තත්ත්වයන් හා සේවා කොන්දේසි පිළිබඳව ප්‍රමිතීන් සැකසීම හා ඒවාට නෛතික තත්ත්වයන් ලබා දීමට කටයුතු කිරීම හා අධීක්ෂණය කිරීම සඳහා පහත පනත් යටතේ කටයුතු කිරීම කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

1. 1941 අංක 27 දරන පඩිපාලක සභා ආඥා පනත
2. 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත
3. 2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත
4. 2016 අංක 03 දරන සේවකයන්ගේ අවම වේතන පනත
5. 2016 අංක 04 දරන අයවැය සහන දීමනා පනත

ඒ අනුව, 2016 වර්ෂයේ ක්‍රියාත්මක කළ වැඩසටහන් පහත පරිදි වේ.

- පඩි පාලක සභා 22ක් සඳහා නියෝජිතයන් පත් කිරීම
- රබර් වැවීම හා දළ රබර් සැකසීම පිළිබඳ පඩිපාලක සභාවේ විරෝධතා කැඳවීම
- රබර් පඩිපාලක සභා සේවා කොන්දේසි සකස්කර පුවත්පත්වල පළ කිරීම
- නැව් තටාක, තොටුපලවල් හා වරායන්හි ප්‍රවාහන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ ආඥාව සකස්කර විරෝධතා සකස් කිරීම
- 2016 අංක 04 දරන අයවැය සහන දීමනාව සහ 2016 අංක 03 දරන අවම වේතන දීමනාව පිළිබඳ දැන්වීම් පුවත්පත්වල පළ කිරීම
- දින පහේ වැඩ සතිය ක්‍රියාත්මක කිරීම සඳහා ලද ඉල්ලීම් 195ක් සඳහා අනුමැතිය ලබා දීම
- සාමූහික ගිවිසුම් 30ක් සඳහා නීතිමය වලංගුභාවය පරීක්ෂාකර වාර්තා කිරීම
- සේව්‍ය සේවක දෙපාර්ශවය දැනුවත් කිරීමේ වැඩසටහන් සහ අයවැය සහන දීමනා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන පැවැත්වීම

## වෘත්තීය සුරක්ෂිතතාවය

අනතුරු සහ උපද්‍රවයන්ගෙන් තොර සහ සෞඛ්‍ය ආරක්ෂිත සේවා පරිසරයක් සේවකයන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ඉහල නැංවීමට ඉවහල් වන අතර නිෂ්පාදිත භාණ්ඩ හා සේවාවන්ගේ ගුණාත්මකභාවය උසස් කිරීමටද හේතු වේ. ඒ අනුව, සේවා ස්ථානවල ඇතිවන ආපදා, අනතුරු සහ වෘත්තීමය රෝගාබාධ අවම කිරීම උදෙසා කම්කරු දෙපාර්තමේන්තුව ක්‍රියා කරනු ලැබේ. 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනත අනුව සේවකයන්ගේ සෞඛ්‍ය හා සුරක්ෂිතතාවය නෛතික අවශ්‍යතාවයක් වේ.

කම්කරු දෙපාර්තමේන්තුව විසින් 2016 වසරේ ලෝක සුරක්ෂිතතා දිනය උදෙසා කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයෙහි ජාතික මට්ටමින් වැඩසටහනක් පවත්වන ලද අතර ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සතිය වෙනුවෙන් වූ වැඩසටහන කොළඹ 02 ඇල්ටෙයාර් ඉදිකිරීම් වැඩබිම ආශ්‍රිතව පවත්වන ලදී.

### 2016 වසර තුල කර්මාන්තමය සුරක්ෂිතතා අංශයේ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

| | |
|---|---|
| කර්මාන්තශාලා පරීක්ෂා කිරීම් | 4975 |
| අධි අන්ත්‍රාදායක යන්ත්‍ර පරීක්ෂාව | 9007 |
| කර්මාන්තශාලා ලියාපදිංචි කිරීම | 1572 |
| නීතිමය කටයුතු | 13 |
| වෘත්තීය සුරක්ෂිතතා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 177 |
| වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය වැඩසටහන් (කර්මාන්ත / වෘත්තීය පුහුණු ශිෂ්‍යයන්ට) | 10 |

### 2016 වසර තුල වෘත්තීය ස්වස්ථතා අංශයේ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

| | |
|---|---|
| පාරිසරික මිනුම් | 46 |
| ජීව විද්‍යාත්මක පරීක්ෂණ | 1283 |
| වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතා විගණනයන් | 212 |
| දැනුවත් කිරීමේ වැඩසටහන් | 168 |
| සේ.අ.අ. (EPF) හා සේ.නි.භා.අ. (ETF) වෛද්‍ය මණ්ඩල | 24 |

## සමාජ කතිකාවත

ඕනෑම රටක නිෂ්පාදන ක්‍රියාවලිය වඩාත් ඵලදායි හා කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාමට ඒ හා සම්බන්ධ සේව්‍ය සේවක දෙපාර්ශවය අතර ගොඩනැගෙන සහයෝගිතාව අත්‍යාවශ්‍යවේ. සේව්‍ය සේවක දෙපාර්ශවය අතර කතිකාවත සහ සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම තුලින් කාර්මික සාමය හා සංහිඳියාව පවත්වා ගෙන යාම පහසුය. මේ

පිළිබඳව ක්‍රියා කිරීමට කම්කරු දෙපාර්තමේන්තුවේ සමාජ කතිකා හා වැඩපොළ සහයෝගිතා ඒකකය පිහිටුවා ඇති අතර එම ඒකකය මගින් සමාජ කතිකාවත ප්‍රවර්ධනය උදෙසා විවිධ වැඩසටහන් දියත් කරනු ලැබේ. මෙම ඒකකය විසින් සමාජ කතිකා හා වැඩපොල සහයෝගිතා සංකල්පය ප්‍රශස්ත මට්ටමින් ක්‍රියාත්මක ආයතන ඇගයීමට තරඟාවලියක් සහ සම්මාන ප්‍රදානෝත්සවයක් පවත්වනු ලබන අතර 2016 නොවැම්බර් මස මෙම සම්මාන ප්‍රදානෝත්සවය කොළඹ 07 ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පවත්වන ලදී.

### භෞතික සම්පත් සංවර්ධනය

කම්කරු දෙපාර්තමේන්තුව සතු භූමියෙහි මහල් 36කින් යුතුව ඉදිකෙරෙන 'මෙහෙවර පියස' ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු කඩිනමින් සිදු වෙමින් පවතී. වර්ෂය තුළ වියදම රු. මිලියන 3122.9කි. මීට අමතරව යාපනය, මුලතිවු, බෙලිඅත්ත සහ කිලිනොච්චි කම්කරු කාර්යාලවල ඉදිකිරීම් කටයුතු නිම කර ඇත.

දැනට පහත කාර්යාලවල ඉදිකිරීම් කටයුතු සිදු වෙමින් පවතී.

| කාර්යාලය | 2016 වර්ෂයේ දරන ලද වියදම රු. මිලියන |
|---|---|
| අවිස්සාවේල්ල | 50 |
| මීගමුව | 21.168 |
| පොළොන්නරුව | 46.7 |
| පුත්තලම | 12 |
| අම්බලන්ගොඩ | 15.310 |
| කුරුණෑගල | 25 |
| මහියංගනය | 13 |
| අනුරාධපුර | 6 |

## 02. මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

2010.02.12 දිනැති අංක 1640/31 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව 2010 වසරේදී කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කරන ලදී. වර්තමානයේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තුව වෙත රාජ්‍ය රැකියා සේවාවන් පවත්වා ගෙන යාම හා ජාතික මානව සම්පත් හා රැකියා ප්‍රතිපත්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇත.

මෙම දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් කාර්යන් ඉටු කරලීමට සිදු වේ.

- ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම.
- රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන කටයුතු
- වෘත්තීය මාර්ගෝපදේශනයට අයත් කටයුතු
- ශ්‍රම වෙළඳපළ තොරතුරු එක්රැස් කිරීම, විශ්ලේෂණය හා බෙදාහැරීම
- රැකියා පියස (Jobs Net) මගින් සිදු කෙරෙන වෙනත් සේවාවන්

සහ ඉහත විෂයන්ට ආනුෂාංගික සහ සම්බන්ධිත සෙසු සියලු කටයුතු.

### දෙපාර්තමේන්තුවේ අංශ

- පාලන, සැලසුම්, ප්‍රගති හා මෙහෙයුම් අංශය
- ගිණුම් අංශය
- මිනිස්බල සැලසුම්, සංවර්ධන හා පර්යේෂණ අංශය
- රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය

2016 දෙසැම්බර් 31 දක්වා මූල්‍ය ප්‍රගතිය

| | ප්‍රතිපාදනය (රු.000) | වියදම (රු.000) | ඉතිරිය (රු.000) |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 330,450 | 328,829 | 1,620 |
| ප්‍රාග්ධන වියදම් | 32,700 | 31,738 | 961 |
| එකතුව | 363,150 | 360,568 | 2,581 |

2016 වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදන

| | පුනරාවර්තන (රු.000) | ප්‍රාග්ධන (රු.000) | එකතුව (රු.000) |
|---|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් | 321,361 | - | 321,361 |

| | | | |
|---|---|---|---|
| සංවර්ධන ක්‍රියාකාරකම් | - | 37,400 | 37,400 |
| එකතුව | 321,361 | 37,400 | 358,761 |

### 2016 වර්ෂයේ ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය හා සම්බන්ධව අත්කර ගත් ප්‍රගතිය.

- ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය වර්තමාන රජයේ මධ්‍යකාලීන සංවර්ධන ප්‍රතිපත්ති රාමුවට අනුකූලව නැවත සංශෝධනය කරන ලදී.

- එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට සෘජුවම අදාල වන බවට හදුනා ගෙන ඇති අමාත්‍යාංශ 25ක් වෙතින්, ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම 2017 - 2021 කාලසීමාවට අදාල වන පරිදි සංශෝධනය කිරීමට යෝජනා කැඳවන ලදී.

- අමාත්‍යාංශ 11 ට අදාලව 2016 වර්ෂයයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම ලබා දී ඇති අතර 2017 වර්ෂයට අදාලව සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අමාත්‍යාංශ 07 ලබා දී ඇත. අනෙකුත් අමාත්‍යාංශ 07 සමඟ සාකච්ඡා හා සම්බන්ධීකරණ කටයුතු සිදු කෙරෙමින් පවතී.

- ප්‍රතිපත්තිය සමඟ සම්බන්ධ වී ඇති අමාත්‍යාංශ වලින් ඉටු කරනු ලබන කාර්යයන් පිළිබඳව ප්‍රගතිය අධීක්ෂණය කිරීමේ කටයුතු ද මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ පිහිටුවා ඇති ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්ති මෙහෙයුම් ඒකකය මඟින් සිදු කරනු ලබයි.

- ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්ති මෙහෙයුම් ඒකකයට අදාල ප්‍රගතිය මැන බැලීමේ කටයුතු සඳහා මාර්ග ගත (Online) මෙහෙයුම් පද්ධතියේ වැඩ කටයුතු දැනට සිදු කෙරෙමින් පවති.

### රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය

**රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශන කටයුතු**

**රැකියා නිර්මාණ**

- ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන්
- අවශ්‍යතා මත පුහුණු වැඩසටහන්
- උද්‍යාන අලංකරණය
- අවධානමට ලක්වූවන් සඳහා පුහුණු වැඩසටහන්

**රැකියා ප්‍රවර්ධන**

- රැකියා පොළ
- රැකියා සමාජ වැඩසටහන
- රැකියා සඳහා යොමු කිරීම
- ස්වයං රැකියා වැඩසටහන්
- නිදහස් රැකියා පෙළඹවීම
- රැකියා 100 වැඩසටහන
- සංචාරක ක්ෂේත්‍රයේ රැකියා ප්‍රවර්ධන වැඩසටහන

**වෘත්තීය මාර්ගෝපදේශන**

- විශ්ව විද්‍යාල
- පාසැල් වැඩසටහන් (උසස් පෙළ/ සාමාන්‍ය පෙළ)
- ගුරුවරුන් සඳහා
- රැකියා විරහිත තරුණ පිරිස
- දෙමව්පියන් සඳහා
- අවධානමට ලක්වූවන් සඳහා
- වෘත්තීය මංපෙත්
- හසර සඟරාව

රැකියාවක් බලාපොරොත්තුවෙන් සිටින හා නව්‍යලෙස රැකියා වෙළඳපළ වෙත ප්‍රවේශ වන හා අනාගතයේ ප්‍රවේශ වීමට නියමිත ජනතාව වෙත සේවා නියුක්ති ආශ්‍රිත පහසුකම් සැපයීමේ අරමුණින් මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව විවිධ වැඩසටහන් පවත්වනු ලබයි.

සාමාන්‍ය පෙළ පාසල් සිසුන්, උසස් පෙළ පාසල් සිසුන් හා පාසල් පද්ධතියෙන් බැහැර වන සිසුන් අරඹයා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පැවැත්වීම සිදු කරනු ලැබේ. මෙම පාසල් කණ්ඩායම් වලට අමතරව ජාතික විශ්ව විද්‍යාල පද්ධතිය තුළ සිටින හා බාහිර උපාධි හදාරන සිසුන් සඳහා ද වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් වාර්ෂිකව පවත්වා ගෙන යනු ලබයි. මේ මගින් උගත් තරුණ පිරිසගේ රැකියා වියුක්තිය අවම කිරීම අරමුණු කරයි.

තවද පාසල් ගුරුවරුන් හා දෙමාපියන් වෘත්තීය වරණය පිළිබඳ දැනුවත් කිරීම් ද සිදු කරනු ලැබේ. රැකියා අපේක්ෂිතයන් තුළ රැකියා වෙළඳපොළට අවශ්‍ය මෘදු කුසලතා වැඩිදියුණු කිරීම සඳහා රැකියා සමාජ වැඩසටහන මඟින් දින පහක පුහුණුවක් ලබා දෙනු ලැබේ.

දෙපාර්තමේන්තුව ග්‍රාමීය ආර්ථිකය ගොඩනැංවීම තුළින් රැකියා අවස්ථා ජනිත කිරීමත් ව්‍යවසායකයින් හා ස්වයං රැකියා ලාභීන් ජනිත කිරීමටත් ක්‍රියා කරනු ලබයි. මේ මගින් පුද්ගලික අංශයේ රැකියා සඳහා තරුණ ප්‍රජාව බල ගන්වනු ලබයි.

ශ්‍රී ලංකාවේ සේවා නියුක්තියෙන් 60% ක් පමණ අවධිමත් අංශයට අයත්ය. දෙපාර්තමේන්තුව මෙහෙය වන වැඩසටහන් වන තෙදින ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන, ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන, ව්‍යවසායකත්ව අවශ්‍යතා මත පුහුණු වැඩසටහන යන වැඩසටහන් මගින් මෙම අවධිමත් අංශය සංවර්ධනය කර එය විධිමත් කරවීමට කටයුතු කරගෙන යනු ලැබේ.

මෙයට අමතරව නිදහස් රැකියා පෙළඹවීම, උද්‍යාන අලංකරණය, රැකියා 100 වැඩසටහන, වෘත්තීය මංපෙත්, ආදී වැඩසටහන් හා හසර සඟරාව වැනි ප්‍රකාශන ද දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබේ.

තවද අවධානමට ලක්වූ කණ්ඩායම් හා විශේෂිත වූ අවශ්‍යතාවයන් සහිත වූවන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන හා රැකියා ගත වීම් පිළිබඳ පුහුණු වීම් පවත්වනු ලැබේ.

## මිනිස්බල සැලසුම්, සංවර්ධන හා පර්යේෂණ අංශය

ශ්‍රම වෙළඳපළ තොරතුරු විවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රතිපත්ති සම්පාදකයින් සඳහා මෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රයේ අධ්‍යාපන වැඩසටහන්, පුහුණු හා කුසලතා සංවර්ධන වැඩසටහන් සම්පාදකයන් සඳහා ද අවශ්‍ය වේ.

ශ්‍රම වෙළඳපළ තොරතුරු රැස් කිරීමේදී සීඝ්‍රව වෙනස් වන කුසලතා සපිරි මානව සම්පත සඳහා ශ්‍රම වෙළඳපළ ඉල්ලුම මනාව අධීක්ෂණය කිරීම හා තක්සේරු කිරීම අත්‍යවශ්‍ය වේ. මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව ශ්‍රම වෙළඳපල තොරතුරු රැස්කිරීම, විශ්ලේෂණය කිරීම හා බෙදා හැරීම කරනු ලබයි.

එමෙන්ම ලංකාවේ කාලීන හා සංවර්ධන අවශ්‍යතාවන්ට සරිලන ලෙස ශ්‍රම වෙළඳපළ පර්යේෂණ හා සමීක්ෂණ පැවැත්වීම, ශ්‍රම ඉල්ලුම හා සැපයුම පිළිබඳ අධ්‍යයන සිදු කිරීම හා එම තොරතුරු බෙදා හැරීම ශ්‍රම වෙළඳපළ ඒකකයෙන් සිදුකරයි. ශ්‍රම වෙළඳපොළ තොරතුරු සඟරාව හා පාසල් පාදක දත්ත අත්පොත මේ මඟින් ප්‍රකාශයට පත් කරනු ලබයි.

මේ අංශය යටතේ මහජන රැකියා සේවා මධ්‍යස්ථාන (PES) ක්‍රියාත්මක වේ. දිවයිනේ දිස්ත්‍රික්ක 25හිම මෙම මහජන රැකියා සේවා මධ්‍යස්ථාන ක්‍රියාත්මක වේ. ප්‍රධාන ජාතික මහජන රැකියා සේවා මධ්‍යස්ථානය (National PES) බත්තරමුල්ල කාර්යාල පරිශ්‍රයෙහි ස්ථාපිත කර ඇත.

දිස්ත්‍රික් රැකියා සේවා මධ්‍යස්ථාන මඟින් සිදු කරනු ලබන කාර්යයන් වන්නේ,

- රැකියා අපේක්ෂිතයින් ලියාපදිංචි කිරීම.
- පුරප්පාඩු සහ ආයතන ලියාපදිංචි කිරීම.
- ආයතනවල පුරප්පාඩු සොයා බැලීම සඳහා කටයුතු කිරීම.
- රැකියා අපේක්ෂිතයින්ගේ රැකියා පුරප්පාඩු පිළිබඳ ලේඛණ සකස් කිරීම.
- සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම හා රැකියා අපේක්ෂිතයින්ගේ සුදුසුකම් තහවුරු කර ගැනීම.
- රැකියා ගැලපීම් හා සම්මුඛ පරීක්ෂණ සඳහා යොමු කිරීම.
- රැකියා ගතකිරීම් හා පසුවිපරම්
- වෘත්තීය මාර්ගෝපදේශන සේවාවන් සැපයීම.
- පුහුණුව සඳහා පහසුකම් සැපයීම.
- රැකියා තත්ත්වයන් පිළිබඳව සංඛ්‍යා ලේඛණ රැස් කිරීම හා ප්‍රකාශයට පත් කිරීම.
- විදේශීය රැකියා අවස්ථා සඳහා මඟ පෙන්වීම.
- දිස්ත්‍රික් රැකියා පොළ වැඩසටහන සංවිධානය කර පැවැත්වීම.

රැකියා අපේක්ෂිතයින් ලියාපදිංචි කිරීම ක්‍රම කිහිපයකට සිදුවේ. ප්‍රාදේශීය මට්ටමේ මානව සම්පත් සංවර්ධන සහකාරවරුන් විසින් හා රැකියා පොළවල්, රැකියා සේවා මධ්‍යස්ථාන හරහා ලබා දෙන තොරතුරු මඟින් මෙම තොරතුරු ලබා ගැනේ.

රැකියා අපේක්ෂිතයින්ගේ අපේක්ෂාවන් පදනම් කරගෙන වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් සංවිධානය කෙරේ.

| අනු අංකය | වැඩසටහන/ ක්‍රියාකාරකම | 2016 වසර සඳහා ඉලක්ක | | 2016/01/01 දින සිට 2016/12/31 දක්වා ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | භෞතික | මූල්‍ය (රු.මි) | භෞතික | මූල්‍ය (රු.මි) |
| | රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය | | | | |
| 1 | අ.පො.ස සාමාන්‍ය පෙළ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන | 1951 | 0.93 | 2274 | 0.8707 |
| 2 | අ.පො.ස උසස් පෙළ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන | 1471 | 0.80 | 1438 | 0.7824 |
| 3 | ස්වයං රැකියා පෙළඹවීම් වැඩසටහන | 60 | 0.20 | 139 | 0.1720 |
| 4 | වෘත්තීය අභියෝග ජය ගැනීම | 60 | 0.53 | 81 | 0.5124 |
| 5 | උපාධි අපේක්ෂිතයන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන (අභ්‍යන්තර) | 12 | 0.46 | 8 | 0.2758 |
| 6 | උපාධි අපේක්ෂිතයන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන (බාහිර) | 12 | 0.46 | 17 | 0.5328 |
| 7 | ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන | 35 | 1.05 | 48 | 0.8829 |
| 8 | දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන | 150 | 0.68 | 290 | 0.4262 |
| 9 | වෘත්තීය මංපෙත් | 8 | 0.19 | 12 | 0.1437 |
| 10 | හසර සඟරාව මුද්‍රණය | 4 | 0.50 | 2 | 0.3185 |
| 11 | ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන | 25 | 0.71 | 53 | 0.6816 |
| 12 | රැකියා සමාජ වැඩසටහන | 25 | 0.85 | 25 | 0.8389 |
| 13 | රැකියා 100 වැඩසටහන | 10 | 0.59 | 13 | 0.4035 |
| 14 | අවශ්‍යතා මත පුහුණු වැඩසටහන | 219 | 2.17 | 328 | 2.1730 |
| | උද්‍යාන අලංකරණ වැඩසටහන | 3 | 0.094 | 3 | 0.0778 |
| | නිදහස් රැකියා ප්‍රවර්ධන වැඩසටහන | 6 | 0.087 | 10 | 0.0970 |
| | සංචාරක ක්ෂේත්‍රයේ රැකියා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 6 | 0.1662 | 5 | 0.1148 |
| | අවධානමට ලක් වූවන් රැකියාගත කිරීමේ වැඩසටහන | 25 | 0.1987 | 22 | 0.1988 |
| 15 | ව්‍යවසායකත්ව අලෙවි ප්‍රදර්ශනය | | | 2 | |
| | මිනිස්බල සැලසුම්, සංවර්ධන හා පර්යේෂණ අංශය | | | | |
| 16 | සෞඛ්‍ය ක්ෂේත්‍ර රැකියා පැතිකඩ | 100% | 0.20 | 100% | 0.2600 |
| 17 | වරාය හා නාවික ක්ෂේත්‍රයේ රැකියා පැතිකඩ | 100% | 0.20 | 100% | - |
| 18 | අවිධිමත් අංශයේ රැකියා යෝග්‍යතාවය අධ්‍යයනය | 100% | - | 100% | - |
| 19 | දිස්ත්‍රික් මට්ටමේ රැකියා යෝග්‍යතාවය අධ්‍යයනය | 100% | FR66 | 100% | 0.0567 |
| 20 | ශ්‍රම වෙළඳපොළ තොරතුරු සඟරාව | 100% | 0.30 | 100% | - |
| 21 | සමාජ ආර්ථික දත්ත අධ්‍යයනය | 100% | 0.30 | 100% | - |
| 22 | ශ්‍රම වෙළඳපොලේ පවතින රැකියා ඉල්ලුම හා සැපයුම අතර කුසලතා නොගැළපීම පිළිබඳ අධ්‍යයනය | 100% | | 86.4% | - |
| | මහජන රැකියා සේවා මධ්‍යස්ථාන | | | | |
| 23 | මහජන රැකියා සේවා මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම හා ආරම්භ කිරීම | 12 | 5 | 7 | 5.824 |
| 24 | මහජන රැකියා සේවා මධ්‍යස්ථාන පවත්වාගෙන යාම | 25 | 1 | 24 | 0.9763 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | රැකියා අපේක්ෂිතයන් ලියාපදිංචි කිරීම | | | 51,489 | |
| | රැකියා පුරප්පාඩු ලියාපදිංචි කිරීම | | | 27,353 | |
| | රැකියා ගැලපීම | | | 32,033 | |
| | රැකියා ගත කිරීම | | | 6,089 | |
| 25 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය රැකියා ගත කිරීම් | | | 8,085 | |
| 26 | දිස්ත්‍රික් රැකියා පොළ පැවැත්වීම | 5 | 2 | 7 | 1.776 |
| 27 | රැකියා සේවා සැපයීමට ශ්‍රම වෙළඳපළ තොරතුරු පද්ධතියක් ස්ථාපනය - මාර්ගගත අන්තර්ජාල බිහිදොරක් | 100% | 3.5 | 100% | 3.492 |
| වෙනත් කාර්යන් හා වැඩසටහන් | | | | | |
| 28 | වෘත්තීය කාර්ය සාධනය වැඩි දියුණු කිරීම (ප්‍රතිලාභින් ගණන) | | | 17,489 | |
| 29 | වෘත්තීය මාර්ගෝපදේශ සේවා සැපයීම (ප්‍රතිලාභින් ගණන) | | | 43,443 | |
| 30 | අවධානමට ලක් වූවන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ සැපයීම (වැඩසටහන් ගණන) | | | 2055 | |
| 31 | විශේෂ වැඩසටහන් | | | 45 | 0.5437 |

**මහජන රැකියා සේවා මධ්‍යස්ථානයේ වැඩසටහන්**

**දිස්ත්‍රික් රැකියා පොළ වැඩසටහනෙහි ප්‍රගතිය**

| දිස්ත්‍රික්කය | සහභාගි වූ රැකියා අපේක්ෂිතයන් සංඛ්‍යාව | සහභාගි වූ ආයතන සංඛ්‍යාව |
|---|---|---|
| කළුතර - මතුගම | 1520 | 60 |
| බදුල්ල | 2178 | 42 |
| මඩකලපුව | 2201 | 18 |
| වවුනියාව | 1642 | 28 |
| මන්නාරම | 1264 | 8 |
| බදුල්ල - වැලිමඩ | 1348 | 37 |
| රත්නපුර | 2223 | 37 |
| එකතුව | 12376 | 230 |

මෙම දිස්ත්‍රික් රැකියා පොළ වැඩසටහන් සඳහා සහභාගි වූ සැමට වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් පවත්වන ලදි.

**ප්‍රාදේශීය රැකියා පොළ වැඩසටහනෙහි ප්‍රගතිය**

| ප්‍රාදේශීය රැකියා පොළ පැවැත්වූ නගරය | සහභාගි වූ රැකියා අපේක්ෂිතයන් සංඛ්‍යාව | සහභාගි වූ ආයතන සංඛ්‍යාව |
|---|---|---|
| කොළඹ | 320 | 11 |
| කුරුණෑගල | 342 | 35 |
| කැස්බෑව | 116 | 12 |
| ඇල්පිටිය | 1361 | 42 |
| කොළඹ | 233 | 18 |
| ගාල්ල | 1608 | 47 |
| කඩුවෙල | 124 | 15 |
| එකතුව | 2372 | 118 |

## දිස්ත්‍රික් මහජන රැකියා මධ්‍යස්ථානයන්හි ප්‍රගති සාරාංශය

| දිස්ත්‍රික්කය | රැකියා අපේක්ෂිතයන් ලියාපදිංචි කිරීම | රැකියා පුරප්පාඩු ලියාපදිංචි කිරීම | රැකියා ගැලපීම් | රැකියා ගත කිරීම් | පුහුණුව සඳහා යොමු කිරීම |
|---|---|---|---|---|---|
| අම්පාර | 3,982 | 339 | 186 | 146 | 149 |
| අනුරාධපුර | 751 | 669 | 819 | 225 | 135 |
| බදුල්ල | 538 | 1,171 | 1,549 | 84 | 89 |
| මඩකලපුව | 7,408 | 2,006 | 2,420 | 210 | 32 |
| කොළඹ | 2,456 | 3,574 | 3,352 | 460 | 83 |
| ගාල්ල | 2,456 | 413 | 1,403 | 271 | - |
| ගම්පහ | 1,251 | 2,000 | 1,271 | 359 | 15 |
| හම්බන්තොට | 1,681 | 1,010 | 1,413 | 261 | 173 |
| යාපනය | 281 | 1,912 | 2,231 | 494 | 10 |
| කළුතර | 1,475 | 1,836 | 626 | 270 | 291 |
| මහනුවර | 2,161 | 472 | 706 | 297 | 299 |
| කෑගල්ල | 3,995 | 2,901 | 956 | 371 | 30 |
| කිලිනොච්චිය | 1,992 | 111 | 265 | 59 | 45 |
| කුරුණෑගල | 4,101 | 959 | 4,338 | 527 | 127 |
| මන්නාරම | 2,366 | 689 | 1,246 | 28 | 223 |
| මාතලේ | 382 | 423 | 256 | 185 | 118 |
| මාතර | 2,270 | 2,645 | 1,554 | 428 | 44 |
| මොණරාගල | 1,123 | 1,248 | 316 | 67 | - |
| පොළොන්නරුව | 1,225 | 521 | 474 | 64 | 250 |
| පුත්තලම | 1,056 | 496 | 495 | 140 | 35 |
| රත්නපුර | 3,875 | 1,125 | 3,241 | 879 | 362 |
| ත්‍රිකුණාමලය | 1,305 | 423 | 684 | 105 | 63 |
| වවුනියාව | 2,236 | 323 | 2,232 | 143 | 247 |
| මුලතිව් | 1,123 | 87 | 109 | 16 | - |
| එකතුව | 51,489 | 27,353 | 32,142 | 6,089 | 2,820 |

## වෘත්තීය අභිලාෂයන් ජය ගැනීම සඳහා වූ ප්‍රාදේශීය රැකියා ගත කිරීමේ වැඩසටහන් (මහජන රැකියා සේවය)

| දිස්ත්‍රික්කය | පැවැත්වූ වැඩසටහන් ගණන | ප්‍රතිලාභීන් ගණන | වැය වූ මුදල (රු) |
|---|---|---|---|
| කොළඹ | 2 | 436 | 29,340 |
| කළුතර | 4 | 168 | 36,890 |
| ගාල්ල | 3 | 89 | 30,000 |
| මාතර | 4 | 486 | 40,000 |
| මහනුවර | 2 | 86 | 19,980 |
| නුවරඑළිය | 3 | 124 | 26,100 |
| කුරුණෑගල | 4 | 212 | 40,000 |
| පුත්තලම | 4 | 309 | 30,115 |
| පොළොන්නරුව | 3 | 91 | 30,000 |
| රත්නපුර | 4 | 205 | 40,000 |

| | | | |
|---|---|---|---|
| කෑගල්ල | 4 | 173 | 39,490 |
| ත්‍රිකුණාමලය | 1 | 10 | 8,650 |
| මඩකලපුව | 1 | 37 | 10,000 |
| වවුනියාව | 3 | 130 | 30,000 |
| යාපනය | 2 | 90 | 17,530 |
| කිලිනොච්චි | 2 | 84 | 20,000 |
| මන්නාරම | 3 | 122 | 30,000 |
| මුලතිව් | 3 | 138 | 30,000 |
| හම්බන්තොට | 4 | 207 | 39,900 |
| අනුරාධපුර | 1 | 77 | 10,000 |
| මාතලේ | 3 | 144 | 30,000 |
| ගම්පහ | 1 | 42 | 10,000 |
| එකතුව | 61 | 3457 | 597,995 |

## 03. ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය 2007 සැප්තැම්බර් 11 වන දින නිල වශයෙන් ස්ථාපිත කරන ලද අතර 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත මඟින් බලාත්මක කරන ලදී. එම ආයතනය, කම්කරු ක්ෂේත්‍රයේ ත්‍රෛයිපාර්ශව හවුල්කරුවන් වන සේව්‍ය පාර්ශවය, වෘත්තීය සමිති නියෝජනය වන සේවක පිරිස් හා රාජයේ නිලධාරින්ගෙන් සැඳුම්ලත් පාලක මණ්ඩලයන් මඟින් පාලනය වේ.

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය වර්තමානයේදී කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වන අතර කම්කරු දෙපාර්තමේන්තුව, අනෙකුත් රජයේ ආයතන, අර්ධ රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික අංශයේ ආයතන සමඟද සහයෝගීව කටයුතු කරනු ලබයි. තවද, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය ජාත්‍යන්තර කම්කරු සංවිධානය වැනි ජාත්‍යන්තර ආයතන සමඟද එක්ව කටයුතු කරනු ලබයි. එම ආයතනය ඉන්දීය ජාතික කම්කරු ආයතනයක් වන වී.වී.ගිරි (V.V.Giri) ආයතනය සමඟ අන්‍යොන්‍ය සහයෝගීතාවය සඳහා අවබෝධතා ගිවිසුමක් ද අත්සන් කිරීමට කටයුතු යොදා ඇත.

කම්කරු අණපනත්, නීති රීති රෙගුලාසි පිළිබඳව දැනුවත් ඵලදායි ශක්තිමත් ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, සංවිධානය හා මෙහෙය වීම මෙම ආයතනය මඟින් සිදු කරනු ලබයි.

මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය තුළ පහත දැක්වෙන ප්‍රධාන අංශ ක්‍රියත්මක වේ.

I) පුහුණු හා සංවර්ධන අංශය
II) පර්යේෂණ, සැලසුම් හා ප්‍රකාශන අංශය
III) පාලන හා මුදල් අංශය

**2016-01-01 සිට 2016-12-31 දක්වා සිදු කළ වැඩසටහන් වල ප්‍රගතිය**

| වැඩසටහන් විස්තරය | සැලසුම් කළ වැඩසටහන් සංඛ්‍යාව | අපේක්ෂා කළ ආදායම(රු.) | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | ලද ආදායම (රු.) |
|---|---|---|---|---|
| ඩිප්ලෝමා | 3 | 3,385,000 | 5 | 7,235,000 |
| එක් දින වැඩසටහන් | 29 | 1,700,000 | 42 | 3,453,200 |
| දෙ දින වැඩසටහන් | 18 | 2,200,000 | 19 | 3,039,000 |
| තුන් දින වැඩසටහන් | 6 | 960,000 | 11 | 1,932,800 |
| විශේෂ වැඩසටහන් | 6 | 1,920,000 | 6 | 1,875,000 |
| සහතික පත්‍ර පාඨමාලා | 3 | 1,200,000 | 7 | 1,417,000 |
| Donor funded | 2 | 3,000,000 | 2 | 1.645,000 |
| වැඩමුළු | 2 | 500,000 | 2 | 590,000 |
| විභාග පැවැත්වීව | 3 | 200,000 | 7 | 208,360 |

### 2016 වර්ෂයේ විශේෂ ක්‍රියාකාරකම්

- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අනුග්‍රහය ඇතිව වෘත්තීය සමිතිවල රැකවණ නිළධාරීන්ගේ ඵලදායිතාවය ඉහළ නැංවීමේ පුහුණු වැඩසටහන.
- එක්සත් ජාතීන්ගේ කාන්තා සංවිධානය සමඟ එකතුවෙන් "ශ්‍රී ලංකා ශ්‍රම බලකායෙන් කාන්තා සහභාගීත්වය ඉහළ නැංවීම" යන තේමාව යටතේ පර්යේෂණයක් ආරම්භ කිරීම.
- 2016.11.17 වන දින "ඉහළ කාර්මික සබඳතාවන් සඳහා කම්කරු නීති පිළිබඳ අවබෝධය" නමින් එක් දින පුහුණු වැඩමුළුවක් Grand Monarch Hotel හිදී පවත්වන ලදී.

## 04. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

2009 අංක 38 දරණ ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත මඟින් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතනයක් ලෙසින් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය පිහිටුවන ලදි. මෙරට තුළ මනා සෞඛ්‍ය හා ආරක්ෂණ ක්‍රියාමාර්ග තුළින් වෘත්තීය අනතුරු හා වෘත්තීය රෝග වැළකීම හා නිවැරදි ආරක්ෂිත ප්‍රතිපත්ති හා ක්‍රමවේදයන් පිළිපැදීම තුළින් යහපත් වැඩ පරිසර තත්වයක් සෑම පුද්ගලයෙකුටම ලබා දීමට ආයතනය නිරතුරුවම කැපවී සිටින අතර මෙවැනි පුහුණුවක් තුළින් ප්‍රතිලාභ ලබාගත හැකි සේවක, සේව්‍ය හා ඕනෑම පුද්ගලයකු සඳහා අවශ්‍ය අධ්‍යාපනයද ලබා දෙනු ලබයි.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයට ඉතාම කෙටි කාලයකින් මෙරට අපනයන සැකසුම් කලාපයේ පිහිටුවා ඇති බොහෝ ආනයන අපනයන සමාගම් සමඟ මෙන්ම නිෂ්පාදන ක්ෂේත්‍රයේ සමාගම් හා වැවිලි ක්ෂේත්‍රයේ සමාගම් සමඟ සේවා කටයුතු සිදු කරමින් ඉතා වටිනා කාර්යයභාරයක් ඉටු කර ඇත. එම ආයතනයන් සමඟ එක්ව ඒ ඒ ආයතනවල වැඩ කරන සේවකයන්ගේ ආරක්ෂාවට හා සෞඛ්‍ය ආරක්ෂා කිරීම උදෙසා විවිධ වැඩසටහන්, දැනුවත් කිරීම් රාශියක් පසුගිය කාලයන්හි සිදු කොට ඇත. මෙම වසරේදීද සේවා කටයුතු ඉහළ මට්ටමකට ගෙන ඒමට මහත් කැපවීමෙන් කටයුතු කළ අතර ඒ පිළිබඳව හා මෙම වසර තුළ සේවාවන් පිළිබඳ සමාලෝචනය මෙහි ඇතුලත්වේ.

### ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ වැඩසටහන් සහ ක්‍රියාකාරකම්

- වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- වැවිලි අංශයේ වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ උසස් සහතිකය
- බොයිලේරු ක්‍රියාකරවන්නන් පුහුණු කිරීම
- කාර්මාන්තයන් පිළිබඳ වැඩ අධ්‍යයන වැඩසටහන
- කර්මාන්ත ක්ෂේත්‍රයේ හෙදියන් පුහුණු කිරීම
- රෝහල් කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය
- කාර්යාලයීය කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය
- පරීක්ෂණාගාරවල වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය
- රසායනික ද්‍රව්‍ය ආරක්ෂා සහිතව පරිහරණය කිරීම
- ආහාර පරිහරණය කරන්නන් සඳහා සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය
- ආතති කළමණාකරන පුහුණු වැඩසටහන

#### 1.පාරිසාරික සමීක්ෂණ

- වාතයේ තත්ත්වය සමීක්ෂණය කිරීම සදහා Indoor Air Quality හා දුම් පරීක්ෂා කිරීම සඳහා Flu Gas Analyzer meter උපකරණය භාවිතා කිරීම
- කර්මාන්තය තුළ දූවිලි මට්ටම් සමීක්ෂණය කිරීම හා දූවිලි පොම්ප උපකරණ භාවිතා කිරීම.
- ඝෝෂා මට්ටම සමීක්ෂණය කිරීම හා ශබ්ද මැනීමට Sound Level Meter උපකරණය භාවිතා කිරීම.
- උෂ්ණත්ව මට්ටම සමීක්ෂණය කිරීම හා Heat Stress Meter (තාප ආතති) දර්ශකය භාවිතා කිරීම.

#### 2. වෛද්‍ය පරීක්ෂණ

- ශ්‍රවණ තත්වය මැනීමේ පරීක්ෂණ
- රුධිර විශ්ලේෂණය
- වැඩ කිරීමට යෝග්‍යතාව තක්සේරු කිරීම
- පෙනහළු ක්‍රියාකාරිත්වය පිලිබඳ පරීක්ෂණ
- දෘෂ්ඨි පරීක්ෂණ

#### 3. වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනයේ සිද්ධි කළමනාකරණය සහ පරිපාලන සේවය

## ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ඩිප්ලෝමා පාඨමාලාව

- අප විසින් මෙම පාඨමාලාව සඳහා න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික දැනුම ලබාදෙන අතර ඒ සඳහා එම කණ්ඩායම් ක්ෂේත්‍ර චාරිකාවන් දෙකක් සඳහා ද සහභාගි කරවීම මෙම පාඨමාලාවේ තවත් අංගයකි. පාඨමාලාව හැදෑරීම තුළින් ලද පුහුණුවෙන් තම සේවා ස්ථානයන්වල වඩාත් සුරක්ෂිත වැඩබිමක් නිර්මාණය කර ගැනීමට ඔවුන්ට හැකියාවක් ලැබෙන අතර ඒ තුළින් වැඩකරන සේවකයන්ගේ ආරක්ෂාවට මනා පිටිවහලක් වී ඇත. එසේම වෘත්තීය සුරක්ෂිතතා නිළධාරීන් ලෙස විවිධ ක්ෂේත්‍රයන්ට මහඟු දායකත්වයක් ලබාදීමට හැකි පිරිසක් අප ආයතනය තුළින් බිහිකර ඇත. එසේම මෙම පාඨමාලාව හැදෑරීමෙන් පසු විදේශීය රැකියා සඳහා සුදුසුකමක් වන අතර මේ වන විටත් පාඨමාලාව සාර්ථකව නිම කළ සිසුන් විදේශීය රටවල සේවා නියුක්තව සිටියි.

## 2016 වර්ෂයේදී ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් පවත්වනු ලැබූ වැඩසටහන්

| වැඩසටහන | ඇස්තමේන්තු ගත මුදල (රු.) | සහභාගි වූ සංඛ්‍යාව | මූල්‍ය ප්‍රගතිය (රු.) |
|---|---|---|---|
| ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 6,862,500 | 114 | 10,431,000 |
| ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 2,790,000 | 105 | 4,882,500 |
| හෙදියන් සඳහා වූ එක් දින පුහුණු පාඨමාලාව | 70,000 | 27 | 70,700 |
| ඉදිකිරීම් කේෂත්‍රය සඳහා වූ තෙදින වැඩමුළු | 283,500 | 62 | 501,000 |
| අපද්‍රව්‍ය කළමණාකරණය පිළිබඳ එක් දින වැඩමුළුව | 210,000 | 54 | 280,500 |
| ආතති කළමණාකරණය පිළිබඳ එක් දින වැඩමුළු | 35,000 | 11 | 55,000 |
| සුපරීක්ෂකවරුන් සඳහා වූ එක් දින සුරක්ෂිතතා වැඩමුළුව | 105,000 | 40 | 140,000 |

## ජාතික වෘත්තීය සුරක්ෂිතතා සතිය

අමාත්‍ය මණ්ඩලය මඟින් සෑම වර්ෂයකම ඔක්තොම්බර් මස 2 වන සතිය රැකියාවල නියුක්ත වෘත්තිකයින්ගේ සෞඛ්‍ය හා සුරක්ෂිතතාවය තහවුරු කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සතිය ප්‍රකාශයට පත් කොට ඇත.

## වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය

මෙම සම්මන්ත්‍රණය 2016 ඔක්තොම්බර් 10 දින සිට 12 දින දක්වා පෙ.ව 9.00 ට කොළඹ ගලදාරී හෝටලයේදී පැවැත්විණි. මෙහි තේමාව වූයේ කර්මාන්ත වල ඇතිවිය හැකි අවධානම් තත්වයන් හා ඒවා මැඩ පැවැත්වීම වෙනුවෙන් ආයෝජනය කිරීමයි. 2012 වර්ෂයේ පටන් වර්ෂයක් පාසා මෙම සමුළුව එහි සාමාජිකත්වය දරන ආසියානු කළාපීය රටවල් වලදී පවත්වනු ලැබූ අතර 2016 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ පැවැත්වීමට යෝජනා කෙරුනි. මෙහි මූලික අරමුණ වනුයේ ආසියාතික රටවල වෘත්තිකයන්ගේ සේවා සුරක්ෂිතතාවය හා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ඒ ඒ රටවල් වල ඇති නව තාක්ෂණයන් හා නව ක්‍රම වේදයන් හුවමාරු කර ගැනීමයි. මෙම සමුළුව සඳහා ජපානය, මැලේසියාව, සිංගප්පූරුව, වියට්නාමය, තායිවානය වැනි රටවල් සහභාගිත්වය දරා තිබිණි.

## වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය

වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය 2016 ඔක්තොම්බර් මස 12 වන දින කොළඹ ගලධාරි හෝටලයේදී පැවැත්විණි. මෙම සම්මන්ත්‍රණය වාර්ෂිකව පවත්වනු ලබන අතර ඒ සඳහා ශ්‍රී ලංකික සේව්‍ය සේවක දෙපාර්ශවය නියෝජනය කරමින් කර්මාන්ත හිමියන් සුරක්ෂිතතා නිළධාරීන් සහභාගි විය. එහිදී දේශීය හා විදේශීය සම්පත් දායකයින්ගේ හරවත් දේශන තුළින් තාක්ෂණික දැනුම ලබා දීමට කටයුතු කරනු ලැබීය.

| වැඩ සටහන | ඇස්තමේ-න්තු ගත මුදල(රු,) | භෞතික ප්‍රගතිය (රු,) | මූල්‍ය ප්‍රගතිය (රු,) |
|---|---|---|---|
| වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සම්මන්ත්‍රණය | 4,000,000 | 450 ක් පමණ පිරිස සහභාගි විය | 4,090,250 |

### වෘත්තීය සුරක්ෂිතතා නිලධාරීන් සඳහා වන ඩිප්ලෝමා ප්‍රධානෝත්සවය.

වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව නිම කළ කණ්ඩායම් 8 හා 9 හි සිසුන් සඳහා වන ඩිප්ලෝමා ප්‍රධානෝත්සවය 2016 ඔක්තෝම්බර් මස 12 වන දින සවස 6.00 ට ගලධාරී හෝටලයේදී පැවැත්විණි.

### ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය විශිෂ්ඨතා සම්මාන උළෙල

මෙම සම්මාන උළෙල 2016 ඔක්තොම්බර් 14 දින නෙළුම් පොකුණ රඟහලේදී ගරු අග්‍රාමාත්‍යතුමාගේ සහභාගිත්වයෙන් 2 වන වරටත් පැවැත්විණ. මෙම සම්මාන උළෙලේදී වැඩ කරන සේවකයින්ගේ වැඩ පරිසරය වෙනුවෙන් වඩාත් කැපවීමෙන් කටයුතු කරන ලද සේව්‍ය ආයතන තෝරා එම ආයතන ඇගයීමට ලක් කරන ලදි. එම ආයතන වලින් අයදුම්පත් කැඳවා, ලද අයදුම්පත් විද්වත් කමිටුවක් මඟින් නිරීක්ෂණය කර සුදුස්සන් තෝරා ගැනීම කරනු ලැබේ. දෙවන වටයේදී විගණන කමිටුව සෑම ආයතනයටම ගොස් පරීක්ෂා කරන අතර අවසාන අදියරේදී තාක්ෂණික කමිටුව හොඳම ආයතනය තෝරා ගැනීම සිදු කරයි.

| වැඩසටහන | ඇස්තමේන්තු ගත මුදල(රු,) | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු,) |
|---|---|---|---|
| ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය විශිෂ්ඨතා සම්මාන උළෙල | 10,090,000 | 1250* | 1,264,500+10,000,000 - 8,912,726 = 2,351,774** |

**මුදල් අමාත්‍යාංශ ප්‍රතිපාදන = 10,000,000 , අනුග්‍රාහක භවතුන්ගේ මූල්‍ය අනුග්‍රහයෙන්

## 05. කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය

සේවයේ යෙදී සිටින අවස්ථාවේදී සිදුවන අනතුරු සම්බන්ධයෙන් වන්දි ලබාදීම සඳහා 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනත පනවා ඇත. මෙම පනතට යම් යම් අවස්ථාවන්හිදී සංශෝධන කිහිපයක් ඇතුළත් වූ අතර, අවසාන සංශෝධනය 2005 අංක 10 පනතින් සිදු කර ඇත. කම්කරු වන්දි උසාවිය, දිසා විනිසුරු හා මහේස්ත්‍රාත් බලතල සහිතව මුළු දිවයිනම ආවරණය වන පරිදි සංචාරක උසාවි 14 කින් ද සමන්විත වේ. අධිකරණ සේවා කොමිෂන් සභාව මගින් පත්කරනු ලබන අධිකරණ නිලධාරීන් වන කම්කරු වන්දි කොමසාරිස්, අතිරේක කම්කරු වන්දි කොමසාරිස් හා නියෝජ්‍ය කම්කරු වන්දි කොමසාරිස් යන තනතුරු 3කින් ද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I වන පන්තියේ තනතුරක්ද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරක් ද ඇතුළු තනතුරු 43 කින් සමන්විත වේ.

එසේම මෙම කාර්යාලය නඩු අංශය, ආයතන අංශය, ගිණුම් අංශය, බාලවයස්කාර වන්දි කටයුතු සහ රක්ෂණ බලපත්‍ර අංශයෙන් සමන්විත වේ.

කම්කරු වන්දි අධිකරණ ක්‍රියාවලිය සඳහා අපරාධ නඩු විධාන සංග්‍රහය, සිවිල් නඩු විධාන සංග්‍රහය සහ සාක්ෂි ආඥා පනත අදාල කර ගන්නා අතර අභියාචන පටිපාටිය දිසා අධිකරණයකට සමාන වේ.

### 01. ප්‍රධාන අරමුණු

- රැකියාවේ යෙදී සිටියදී සිදුවන අනතුරු වලින් තුවාල ලබන සේවකයින්ට
- රැකියාවේ ස්වභාවය නිසා වැළඳුණු රෝගවලින් පීඩා විඳින සේවකයින්ට
- සේවයේ යෙදී සිටින විට සිදුවන අනතුරු වලින් මියයන සේවකයින්ගේ යැපෙන්නන්ට

වන්දි අයකර දීම.

1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනතේ බලතල හා විධිවිධාන අනුව කම්කරු වන්දි කොමසාරිස්ට හිමි ප්‍රධාන කාර්යභාරයන් වන්නේ,

1. රජයේ සහ පෞද්ගලික අංශයේ සේවකයන්ට සේවයේ යෙදී සිටියදී සිදුවන අනතුරු, වෘත්තීය රෝගාබාධ සහ මරණයකදී නම් යැපෙන්නන්ට වන්දි අයකර දීමේ කටයුතු (2005 අංක 10 දරණ අවසන් සංශෝධනයට අනුව ලබාදිය හැකි උපරිම වන්දි මුදල රු:550,000/= කි.)

2. බාල වයස්කරුවන් වයස් පූර්ණත්වයට පත්වන තුරු කම්කරු වන්දි කොමසාරිස් භාරයේ ජාතික ඉතිරිකිරීම් බැංකුවේ ගිණුම් පවත්වාගෙන යෑම හා ඒවායේ පරිපාලන කටයුතු.

3. සේවකයන්ට සිදුවන අනතුරකදී සේවා යෝජකයන් වන්දි ගෙවීම පැහැර හැරි අවස්ථාවල ඔවුන්ගේ නිශ්චල හා චංචල දේපල තහනමට ගෙන ඒවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා වන්දි මුදල් අයකර දීම.
4. එමෙන්ම කම්කරු වන්දි රක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම, අළුත් කිරීම, බලපත්‍ර අවලංගු කිරීමේ කටයුතු.
5. සේවකයකුට අනතුරක් සිදුවූ විට එම ස්ථානයට ගොස් පරීක්ෂා කර බැලීම.
6. ලංකාවේ ලියාපදිංචි කර ඇති නැව්වල සහ ගුවන් නැව්වල සේවකයන්ට ලංකාවෙන් පිටත දී සිදුවන අනතුරු සඳහා වන්දි අයකර දීම.

### 02. 2016.01.01 සිට 2016.12.31 දක්වා ප්‍රගතිය (උසාවි කටයුතු)

| කාර්යය | 2016.01.01 - 2016.12.31 |
|---|---|
| විධිමත් ලෙස වාර්තාගත කරන ලද අනතුරු සංඛ්‍යාව | 419 |
| විභාගයට ගන්නා ලද ලිපිගොනු සංඛ්‍යාව | 2789 |
| කටයුතු අවසන් කරන ලද වන්දි අයදුම්පත් සංඛ්‍යාව | 437 |
| ලියාපදිංචි කළ ගිවිසුම් සංඛ්‍යාව | 122 |
| මාරක අනතුරු සම්බන්ධයෙන් වන්දි ලෙස අයකර ගත් මුදල් (රු.මි) | 87.29 |
| මාරක නොවන අනතුරු වෙනුවෙන් උසාවි නියෝගයන් අනුව සේවා යෝජකයන් විසින් සේවකයන්ට ගෙවන ලද වන්දි මුදල් ප්‍රමාණය (රු.මි) | 29.57 |
| ලියාපදිංචි කළ ගිවිසුම්පත් අනුව මාරක නොවූ අනතුරු වෙනුවෙන් සේවකයින්ට ගෙවා ඇති වන්දි මුදල් ප්‍රමාණය(රු.මි) | 10.18 |
| මාරක අනතුරු සම්බන්ධයෙන් අයකර ගන්නා ලදුව බාලවයස්කාර යැපෙන්නන්ගේ ඉතිරිකිරීමේ ගිණුම්වල තැන්පත් කළ මුදල් ප්‍රමාණයන්. (රු.මි) | 18.04 |
| බාලවයස්කරුවන් වෙනුවෙන් විවෘත කළ ගිණුම් සංඛ්‍යාව | 107 |
| බාලවයස්කරුවන්ගේ වයස අවුරුදු 18 සම්පූර්ණ වීමෙන් පසු නිදහස් කළ ගිණුම් සංඛ්‍යාව | 166 |
| නිදහස් කළ බාලවයස්කාර ගිණුම් වලින් ගෙවූ මුදල් ප්‍රමාණය (රු.මි) | 10.71 |

### 03. 2016.01.01 සිට 2016.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2016 වර්ෂයේ ප්‍රතිපාදන (රු.මිලියන) | 2016.01.01 සිට 12.31 දක්වා වියදම (රු.මිලියන) | ඉතිරිවීම් (රු. මිලියන) | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 25.1 | 24.9 | 0.2 | 99.01% |
| ප්‍රාග්ධන වියදම් | 0.5 | 0.4 | 0.1 | 81.02% |
| මුළු වියදම් | 25.6 | 25.3 | 0.3 | 98.72% |

## 06. ශ්‍රම වාසනා අරමුදල

1998 අංක 12 දරණ පනතින් ස්ථාපිත ශ්‍රම වාසනා අරමුදල කම්කරු අමාත්‍යාංශය යටතේ පවතින කම්කරු සුභ සාධනය උදෙසා ආරම්භ කරන ලද ආයතනයකි. ශ්‍රම වාසනා අරමුදල පනතේ අරමුණු 6 ඔස්සේ ආරම්භයේ සිට මේ දක්වා විවිධ සුභ සාධන වැඩසටහන් පවත්වා ශ්‍රී ලාංකීය සේවා නියුක්තිකයින්ගේ උන්නතියට කටයුතු සම්පාදනය කර ඇත.

ශ්‍රම වාසනා අරමුදල වෙත ප්‍රධාන ආදායම් මාර්ගය ලෙස ජාතික ලොතරැයි මණ්ඩලය විසින් ලබා දෙන ජාතික සම්පත ලොතරැයි අරමුදල හැඳින්විය හැක. ජාතික සම්පත ලොතරැයි අලෙවිය ක්‍රම ක්‍රමයෙන් වැඩිවෙමින් පවතින අතර එම දායකත්වය වැඩිවීමත් සමඟ කම්කරු සුභ සාධනය උදෙසා සිදු කිරීමට නියමිත සේවාවන් ද වර්ධනය කර ගත හැක.

### ශ්‍රම වාසනා අරමුදලේ අරමුණු

(ආ) සේවා නියුක්තයන්ගේ සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම.

(ආ) සේවා නියුක්තයන් සේවයෙහි යෙදී සිටි

ආයතන පූර්ව දැනුම් දීමකින් තොරව වසා දැමූ අවස්ථාවකදී එම සේවා නියුක්තයන්ට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීම.

(ඇ) හදිසි අවස්ථාවල දී සේවා නියුක්තයන්ට වෛද්‍ය හා වෙනත් පහසුකම් සැපයීම.

(ඈ) සේවා නියුක්තයන්ට විරුද්ධව පරීක්ෂණ ආරම්භ කරනු ලැබූ විටක දී ඔවුන්ට තාවකාලික ආධාර සැපයීම.

(ඉ) ව්‍යසන අවස්ථාවල දී සේවා නියුක්තයන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ සැපයීම.

(ඊ) සේවා නියුක්තයන්ගේ සුභ සාධනය සඳහා විශිෂ්ඨ සේවයක් කර ඇති තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීම.

**ශ්‍රම වාසනා අරමුදල සඳහා ලැබීම.**

(අ) පාර්ලිමේන්තුව විසින් අරමුදලේ අරමුණු ඉටුකර ගැනීමේ කාර්ය සඳහා කලින් කල සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල්.

(ආ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගේන් ප්‍රධාන, ත්‍යාග හෝ පරිත්‍යාග වශයෙන් ලැබෙන සියලුම මුදල්

(ඇ) අරමුදල මගින් කරන ආයෝජන වලින් ආදායම වශයෙන් ලැබෙන මුදල්

(ඈ) 13 වන වගන්තියේ සඳහන් ලොතරැයි වලින් ලැබෙන මුදල් ද ඇතුලුව, මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේදී සහ කර්තව්‍ය ඉටු කිරීමේදී අරමුදල ලැබෙන සියලු මුදල්.

ශ්‍රම වාසනා අරමුදල පෞද්ගලික අංශයේ සේවකයින් ආවරණය වන පරිදි පිහිටුවා ඇති අතර ස්වයං රැකියා කරනු ලබන පිරිස මෙමගින් ආවරණය නොවේ. ශ්‍රම වාසනා අරමුදලේ මූල්‍ය ධාරිතාව මත විවිධ වැඩසටහන් එක් එක් සීමාවන් තුළ ක්‍රියාත්මක කරනු ලැබේ. මූල්‍ය ධාරිතාව වැඩිවීමත් සමඟ එම සීමා වලින් ඔබ්බට තව දුරටත් සේවාවන් පුළුල් කිරීම 2012 වර්ෂයේදී සිදු කරන ලදී.

**ශ්‍රම වාසනා අරමුදල මඟින් සේවා නියුක්තිකයින්ගේ සුභසාධනය සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් / ව්‍යාපෘති**

| | වැඩසටහන / ක්‍රියාකාරකම | පැවැත් වූ වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභින් සංඛ්‍යාව | වියදම් වූ මුදල (රු.) |
|---|---|---|---|---|
| 01 | අක්ෂි වෛද්‍ය සායන | 7 | 3288 | 2,345,000 |
| 02 | ශිෂ්‍යත්ව වැඩසටහන්/පාසැල් උපකරණ ලබා දීම | 5 | 1418 | 3,333,092 |
| 03 | දැනුවත් කිරීමේ වැඩසටහන් | 12 | 2260 | 424,335 |
| 04 | අපදාවට පත්වූවන් සඳහා වියලි ආහාර ලබා දීම | 9 | 600 | 1,680,000 |
| 05 | සවිබල ගැන්වීමේ වැඩසටහන් | 3 | 362 | 1,000,000 |
| 06 | යාපනය ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ශ්‍රම වාසනා අරමුදලේ ප්‍රවර්ධන වැඩසටහන | | | 16,000 |
| 07 | කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයේ සේවක සේවිකාවන්ගේ සුභසාධනය සඳහා ප්‍රවර්ධන වැඩසටහනක් පැවැත්වීම | | | 640,000 |

# කම්කරු දෙපාර්තමේන්තුව - සංඛ්‍යා ලේඛණ

## කාර්මික සම්බන්ධතා අංශය

| | | 2012 | 2013 | 2014 | 2015 | 2016 * |
|---|---|---|---|---|---|---|
| කාර්මික ආරවුල් පිළිබඳ සංඛ්‍යා ලේඛණ | | | | | | |
| වාර්තා වූ සංඛ්‍යාව | | 3702 | 3204 | 2948 | 1561 | 2163 |
| විසඳූ සංඛ්‍යාව | | 3695 | 3077 | 2903 | 1493 | 1869 |
| ලියාපදිංචි කරන ලද සාමූහික ගිවිසුම් සංඛ්‍යාව | | 43 | 34 | 50 | 40 | 21 |
| වෘත්තීය සමිති කටයුතු | | | | | | |
| ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිති/ සම්මේලන | | 114 | 108 | 125 | 196 | 147 |
| අවලංගු කරන ලද වෘත්තීය සමිති/ සම්මේලන | | 02 | 114 | 255 | 315 | 269 |
| ක්‍රියාත්මක සමස්ත වෘත්තීය සමිති ගණන | | | | | 1888 | 1747 |
| ක්‍රියාත්මක සමස්ත වෘත්තීය සම්මේලන | | | | | 30 | 38 |
| කාර්මික අධිකරණ කටයුතු | | | | | | |
| අනිවාර්ය බේරුම්කරණයට යොමු කිරීම | | 43 | 49 | 53 | 28 | 62 |
| ප්‍රධාන නිකුත් කිරීම | | 26 | 35 | 42 | 35 | 25 |
| වැඩ වර්ජන වාර්තා වීම පිළිබඳ සංඛ්‍යාලේඛණ | | | | | | |
| වැඩ වර්ජන වාර්තා වීම | වතු | 14 | 22 | 31 | 20 | 26 |
| | ආයතන | 20 | 20 | 07 | 16 | 15 |
| සහභාගී වූ සේවක සංඛ්‍යාව | වතු | 4338 | 5031 | 4833 | 5229 | 10758 |
| | ආයතන | 5626 | 6088 | 1618 | 3171 | 10167 |
| අහිමි වූ මිනිස් දින ගණන | වතු | 25043 | 41669 | 29165 | 29743 | 85727 |
| | ආයතන | 10774 | 38754 | 8158 | 8630 | 18690 |
| සේවය අවසන් කිරීමේ අංශයේ කටයුතු | | | | | | |
| පැමිණිලි යොමු වූ සංඛ්‍යාව | | 92 | 134 | 149 | 171 | 160 |
| පැමිණිලි විසඳූ සංඛ්‍යාව | | 143 | 112 | 148 | 162 | 86 |
| සේවය අවසන් කිරීම සම්බන්ධ ඉල්ලුම්පත් සම්බන්ධයෙන් අවසර දීම | | 31 | 41 | 51 | 24 | 14 |
| **සමාජ කතිකා අංශය** | | | | | | |
| සමාජ කතිකාවත පිළිබඳ වැඩසටහන් පැවැත්වීම | | | | | | |
| සමාජ කතිකා අංශය මගින් | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | 153 | 187 | 85 | 80 | 82 |
| | සහභාගි වූ සේවක සංඛ්‍යාව | 4751 | 6560 | 4186 | 4403 | 4483 |
| දිස්ත්‍රික් හා උප කාර්යාල මගින් | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | 225 | 214 | 101 | 116 | 57 |
| | සහභාගි වූ සේවක සංඛ්‍යාව | 7902 | 7768 | 3714 | 4094 | 1723 |

## නීති ක්‍රියා අංශය

| පනත | ගොනු කළ නඩු සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
| පාරිතෝෂික ගෙවීම් පනත | 3404 | 2371 | 2044 | 3171 | 2079 |
| කාර්මික ආරවුල් පනත | 77 | 126 | 146 | 153 | 76 |
| සේවය අවසන් කිරීමේ පනත | 59 | 58 | 36 | 49 | 41 |
| පඩි පාලක සභා ආඥා පනත | 290 | 203 | 244 | 282 | 97 |
| සාප්පු හා කාර්යාල සේවක පනත | 132 | 112 | 88 | 99 | 31 |
| ප්‍රසූතිකාධාර ආඥා පනත | 02 | 05 | 03 | 03 | 01 |
| ස්ත්‍රීන්, තරුණඅය සහ ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ පනත | 10 | 07 | 11 | 05 | 06 |
| සේවක අර්ථසාධක අරමුදල් පනත | 3210 | 3415 | 3244 | 2779 | 2172 |
| කම්කරු විනිශ්චය සභා නියෝග | 165 | 144 | 183 | 164 | 104 |
| අයවැය සහන දීමනා පනත | 134 | 22 | 32 | 29 | 22 |
| අනුමත අර්ථසාධක අරමුදල් | 07 | 01 | 07 | 03 | 27 |

## විශේෂ විමර්ශන අංශය

| | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| පැමිණිලි පරීක්ෂණ | 264 | 122 | 84 | 292 | 522 |
| ගණනය කරන ලද සේ.අ.අ. හිඟ වටිනාකම (රු. දහස්) | 313770 | 28012 | 11338 | 634969 | 377481 |
| ගණනය කරන ලද හිඟ ව්‍යවස්ථාපිත මුදල් වටිනාකම (රු. දහස්) | 40831 | 5814 | 898 | 4996 | 32140 |

## කර්මාන්තමය සුරක්ෂිතතා අංශය

| | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| ලියාපදිංචි කරන ලද මුළු කර්මාන්ත ශාලා සංඛ්‍යාව (වර්ෂය අවසාන දිනට) | 22459 | 23974 | 25236 | 26198 | 27570 |
| සිදුකරන ලද පරීක්ෂණ සංඛ්‍යාව | 6700 | 6372 | 5063 | 5090 | 4975 |
| පරීක්ෂකයින් (ඉංජිනේරුවරුන්) සංඛ්‍යාව | 28 | 28 | 30 | 28 | 27 |
| පිඹුරුපත් අනුමැතිය | 106 | 97 | 111 | 130 | 149 |
| දේශන හා සම්මන්ත්‍රණ | 229 | 218 | 147 | 205 | 177 |

## වෘත්තීය ස්වස්ථතා අංශය

| | |
|---|---|
| පාරිසරික මිනුම් | 46 |
| ජීව විද්‍යාත්මක පරීක්ෂණ | 1283 |
| වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතා විගණනයන් | 212 |
| දැනුවත් කිරීමේ වැඩසටහන් | 168 |
| සේ.අ.අ. (EPF) හා සේ.නි.භා.අ.(ETF) වෛද්‍ය මණ්ඩල | 24 |

## සේවක අර්ථසාධක අරමුදල් අංශය

| | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| සමස්ත සාමාජික ගිණුම් සංඛ්‍යාව | 14559328 | 15203073 | 15831410 | 16860334 | 16860334 |
| මුළු සේවායෝජක සංඛ්‍යාව | 198893 | 204777 | 210595 | 216696 | 216696 |
| අරමුදලේ වටිනාකම (රු. මිලියන) | 1144409 | 1299974 | 1486931 | 1664852 | 1841494 |
| සක්‍රිය සාමාජික සංඛ්‍යාව (මිලියන) * | 2.34 | 2.40 | 2.40 | 2.54 | 2.57 |
| සක්‍රිය සේවායෝජක සංඛ්‍යාව ** | 68140 | 69148 | 69683 | 72578 | 74842 |

| | | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|
| නව ලියාපදිංචි කිරීම් | සේවාදායකයින් | 127138 | 813010 | 827883 | 831021 | 620806 |
| | සේවා යෝජකයින් | 10060 | 7802 | 6176 | 6516 | 7178 |
| ප්‍රතිලාභ ගෙවීම් | ප්‍රතිලාභින් සංඛ්‍යාව | 115654 | 114275 | 127492 | 136815 | 187147 |
| | ගෙවූ ප්‍රතිලාභ මුදල (රු. මිලියන) | 48015 | 50062 | 65118 | 77769 | 108393 |
| දායක මුදල් රැස්කිරීම (රු. මිලියන) | | 70157 | 77335 | 90049 | 102453 | 118327 |
| සේ.අ.අ. නිවාස ණය | අනුමත කළ අයදුම්පත් සංඛ්‍යාව | 11182 | 16268 | 17786 | 13132 | 12500 |
| | අනුමත කළ මුදල් වටිනාකම (රු. මිලියන) | 3951 | 6914 | 8021 | 5377 | 8320 |

* වර්ෂය තුල එක්වරක් හෝ දායක මුදල් ගෙවන ලද සාමාජික ගිණුම්

** වර්ෂය තුල එක්වරක් හෝ සේවකයන් වෙනුවෙන් දායක මුදල් ගෙවන ලද සේව්‍යයන්

\# 2014.12.31 දිනට තොරතුරුය

\## 2015.09.30 දිනට තොරතුරුය

## දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රගතිය

| | | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | ප්‍රතිපාදනය (රු.) | 967,407,000 | 1,100,630,000 | 1,138,550,000 | 1,411,200,000 | 1,489,860,000 |
| | වියදම (රු.) | 953,894,760 | 1,016,129,728 | 1,117,107,412 | 1,364,002,819 | 1,453,173,725 |
| ප්‍රාග්ධන වියදම | ප්‍රතිපාදනය (රු.) | 372,365,000 | 760,275,000 | 373,200,000 | 1,705,904,000 | 5,060,720,000 |
| | වියදම (රු.) | 299,512,890 | 732,936,934 | 306,883,422 | 1,574,171,513 | 3,471,977,424 |

# අමාත්‍යාංශයේ විශේෂ ක්‍රියාකාරකම්වලින් බිඳක්



"නිල මෙහෙවර" ජනපති ජංගම සේවය
පොළොන්නරුව




ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය
විශිෂ්ඨතා සම්මාන උළෙල - 2016




ලෝක ළමා ශ්‍රම විරෝධී දින
සැමරුම් උත්සවය




කම්කරු නීති ප්‍රතිසංස්කරණය
සඳහා වන කතිකාව



කම්කරු ක්ෂේත්‍රය පිළිබඳ විද්වත් කතිකාවත:
"ශ්‍රමය හා රැකිරක්ෂා"



ශ්‍රම වාසනා අරමුදල මගින් ආබාධිත
පුද්ගලයන් සඳහා ආධාර ලබා දීම

# අමාත්‍යාංශයේ විශේෂ ක්‍රියාකාරකම්වලින් බිඳක්



සමාජ කතිකාවත පිළිබඳ දීප  ව්‍යාප්ත තරඟාවලිය




ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයෙහි ඩිප්ලෝමා ප්‍රධානෝත්සවය



මහජන රැකියා සේවා මධ්‍යස්ථානයක් විවෘත කිරීමේ අවස්ථාවක්




ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයෙහි ඩිප්ලෝමා ප්‍රධානෝත්සවය



ශ්‍රම වාසනා අරමුදල මඟින් කටුනායක ආයෝජන  ප්‍රවර්ධන කලාපය සඳහා දැල්පන්දු ක්‍රීඩාංගනයක් ලබා දීම



ජාතික කම්කරු උපදේශන සභා රැස්වීමක්

**කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය**
**தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சு**
**MINISTRY OF LABOUR AND TRADE UNION RELATIONS**

ශ්‍රී ලංකාවේ අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවයේ නියුක්ත වූවන්ගේ ජීවන හා සේවා තත්ත්වයන් වර්ධනය කිරීම මෙන්ම රටේ නිෂ්පාදනය හා ශ්‍රම ඵලදායිතාව ඉහළ නැංවීමට අවශ්‍ය වන කාර්මික සාමය සහ සේව්‍ය-සේවක සබඳතාව ස්ථාපනය කරමින් අදාළ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ ඒවා ක්‍රියාවට නැංවීම, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ මූලික පරමාර්ථ වේ. සේවක ජනතාවගේ සුබසාධනය උදෙසා වරින්වර ඇති කරන ලද කම්කරු නීති හා අණපනත් අනුව මෙම අමාත්‍යාංශයට පැවරෙන කාර්ය භාරයද පුළුල්ය.

இலங்கையில் நியதிச் சபைகள் மற்றும் தனியார்துறை நிறுவனங்களில் பணியாற்றுகின்ற அண்ணளவாக 8.5 மில்லியன் தொழிலாளர்களின் வாழ்க்கை மற்றும் தொழில் தரங்களை அதிகரித்தல் உட்பட தேசியஉற்பத்தி மற்றும் தொழில் உற்பத்தித்திறன் அதிகரிப்பிற்குத் தேவையான தொழில் அமைதி, தொழில்வழங்குநர் - தொழிலாளரிடையேயான உறவுகளை உருவாக்கி குறித்த கொள்கைகளைத் தயாரித்தல், அவற்றை அமுலாக்குதல் போன்றவை தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சின் பிரதான குறிக்கோள்களாகும். தொழிலாளர்களின் நலன்களை முன்னிட்டு அடிக்கடி உருவாக்கிக்கொண்ட தொழிற்சட்டங்கள், ஒழுங்குவிதிகளுக்கேற்ப இந்த அமைச்சிற்குப் பொறுப்பாக்கப்பட்டுள்ள கடமைகளும் விரிவானதாகும்.

Main objectives of the Ministry of Labour and Trade Union Relations are formulation of policies and implement those policies that establish the industrial peace and employer and employee relationship, which are pre-requisites for the increase of the production and the labour productivity, with the view of improving the quality of life and service conditions of the working population of about 8.5 million, who are employed in the private and semi-government sector of Sri Lanka. The functional area entrusted to this ministry gets broadened along with labour laws and legislations that are formed from time to time, for the welfare of the working people.

**තැ. පෙ. 1519, දෙවන මහල, කම්කරු මහලේකම් කාර්යාලය, නාරාහේන්පිට, කොළඹ 05.**
த. பெ. 1519, 2 ஆவது தளம், தொழில் செயலகம், நாரஹேன்பிட்டி, கொழும்பு 05.
**P. O. Box 1519, 2nd Floor, Labour Secretariat, Narahenpita, Colombo 05.**